# නීතිය දැනගනිමු

## ශ්‍රී ලංකාවේ නීතිය සහ අයිතිවාසිකම් පිළිබඳ මූලික මාර්ගෝපදේශය



LET US WORK FOR SOCIAL CHANGE

ISD

සමාජ සංවර්ධන ආයතනය (ISD)

Training Module : Developing Capacities of Grassroots Peace and Reconciliation Workers
Copyright : Institute of Social Development, Kandy.
November 2021

Published by :
Institute of Social Development (ISD)
No. 246/4, Ranawana Road,
Katugastota, 20800,
Sri Lanka.

Module Designed by :
Mrs. Ermiza Tegal Attorney-at-Law

Image Source : Google Images

Printed by :
www.printsrilanka.com

kandyisd@sltnet.lk
+94 81- 2071288
http://www.isdkandy.org
https://www.facebook.com/ISD91

# පෙරවදන

1991 වර්ෂයේ මහනුවර සමාජ සංවර්ධන ආයතනය පිහිටුවේ, සමාජයේ නිසි අවදානයක් නොදෙන ප්‍රජාවක් වන උඩරට කඳුකර තේ කර්මාන්තයේ යෙදෙන පිරිසගේ මූලික අයිතිවාසිකම් රැකගැනිම සහ ලබා ගැනීම අරමුණු කොටගෙන ය. ඒ සඳහා මුල සිටම ISD ආයතනය වතු කම්කරුවන්ගේ වෘත්තීය සමිති, සිවිල් සංවිධාන, සමාන අරමුණු තිබූ සංවිධාන සහ පුද්ගලයන් සමඟ එකමුතුව වතු ප්‍රජාවගේ අයිතිවාසිකම් සහ අභිමානය තහවුරු කිරීම වෙනුවෙන් සමාජ දැනුවත් කිරීම් සහ රජයේ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම වෙනුවෙන් විශාල මෙහෙවරක් ඉටු කර ඇත.

2015 සිට ISD ආයතනය සමඟිය, සමානාත්මතාවය සහ සංහිඳියාව මුල්කොටගත් සමාජයක් සඳහා සංක්‍රාන්ති යුක්තිය සහ සංහිඳියාව පිළිබඳ කටයුතු කරමින් පවතී. මේ සඳහා සත්‍ය සහ සංහිඳියාව නමින් සංවිධානයක් ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන අන්දමේ ජාලයක් පිහිටුවා ඇත. මෙම කමිටුව සමාජයේ විවිධ ප්‍රජාවන් සමඟ ප්‍රතිසන්ධානය සහ සංහිඳියාව වෙනුවෙන් කටයුතු කරන දේශීය රාජ්‍ය නොවන සංවිධාන, සිවිල් සංවිධාන සහ තනි පුද්ගලයන්ගෙන් සමන්විතව වේ.

පුරවැසි අයිතිවාසිකම් පිළිබඳ තවදුරටත්, ඉහත සඳහන් සංවිධානයේ පිරිසගේ දැනුම වර්ධනය කිරීමට ISD ආයතනය “නීතිය සහ පුරවැසි අයිතිවාසිකම්” නමින් අත් පොතක් නිර්මාණය කිරීමට අදහස් කොට ඇත.

සමාජ ක්‍රියාකාරීන්ට එදිනෙදා පාවිච්චියේදී නීතිය සහ පුරවැසි අයිතිවාසිකම් පිළිබඳ දැනුම සහ තොරතුරු ලබා දීම මෙහි අරමුණ වේ.

මෙම අත්පොත ඔවුනට රටේ නීතිය පිළිබඳ දැනුවත්ව සමාජ කටයුතු සඳහා අවධානය යොමු කිරීමට සහ එම දැනුම සමාජයේ සැම පුරවැසියෙකුටම ලබාදීමට ඉතා ප්‍රයෝජනවත් වේ යැයි මා විශ්වාස කරමි.

මෙම ප්‍රකාශනයට International Coalition Sites of Conscience ආයතනය විසින් සහයෝගය දක්වයි.

**P. මුතුලිංගම්**
විධායක අධ්‍යක්ෂක
මහනුවර සමාජ සංවර්ධන ආයතනය
246/4, රණවන පාර,
කටුගස්තොට.

# අයිතිවාසිකම් අත්හැරීමේ ප්‍රකාශනය - වියාචනය

මෙම ලේඛණය මඟපෙන්වීමක් පමණක් වන අතර එම නිසා මෙම ලේඛණයේ දක්වා ඇති තොරතුරු නිවැරදි, යාවත්කාලීන හෝ කිසියම් විශේෂිත අවස්ථාවක තත්ත්වයන්ට අදාළ වන බවට සහතිකයක් නොමැත. මෙම මාර්ගෝපදේශය මඟින් සපයනු ලබන උපදෙස් මත ගනු ලබන තීරණ සඳහා පාඨකයා වගකීම ගත යුතු අතර, මෙම මාර්ගෝපදේශය භාවිතා කරන විට සේවාදායකයා වෙත ලබා දී ඇති තොරතුරු නිවැරදි හා යාවත්කාලීන බවට සහතික විය යුතු ය. මෙම ලේඛණය භාවිත කිරීම නිසා මෙහි අන්තර්ගත තොරතුරු භාවිතය හෝ මෙම ලේඛණය වෙත ප්‍රවේශ වීම හේතුකොටගෙන පැනනඟින ඕනෑම ආකාරයක සෘජු, වක්‍ර, විශේෂ, ප්‍රතිවිපාක හෝ වෙනත් අලාභ හෝ හානි සඳහා මෙම සංවිධානය සතුව කිසිදු වගකීමක් නොමැති අතර ඒ සම්බන්ධව මෙම මාර්ගෝපදේශය වැඩිදියුණු කර සහ/ හෝ බෙදා හරින ලද සංවිධානය වෙත වගකීමක් පැවරිය නොහැකි ය.

නීතියට නිරන්තරයෙන් සිදුකරනු ලබන වැඩිදියුණු කිරීම් හා සංශෝධනයන් සැළකිල්ලට ගනිමින් මෙම අයිතිය අත්හැරීම හෙවත් වියාචනය සිදුකිරීම අත්‍යවශ්‍ය වේ. එබැවින් ලේඛණය නිරවද්‍යතාවය සඳහා පරීක්ෂා කර තිබෙනුයේ මෙම අත්පොත මුද්‍රණය කරන අවස්ථාවේ දී රටේ පවතින නීතිය සැළකිල්ලට ගෙන සහ ඊට අදාළව පමණි. මෙය අත්අඩංගුවට ගෙන රඳවාගෙන සිටින පුද්ගලයින් හට ලබාගත හැකි මූලික හා පොදු ආරක්ෂණ ක්‍රම හා ඇප ලබාගැනීම සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා මාර්ගෝපදේශකයක් වශයෙන් භාවිත කළ හැකි ය. ශ්‍රී ලංකාවේ අදාළ වන විවිධ නීතිමය තන්ත්‍රයන් තුළ හැසිරෙන වෘත්තිකයකුට සහාය වීම සඳහා එය මාර්ගෝපදේශයකයක් ලෙස භාවිත කළ හැකි ය. කෙසේ වෙතත්, මෙයින් පූර්ණ හා නිසි නීති උපදේශයක් ලබාදිය නොහැකි අතර, සපයනු ලබන නීතිමය ක්‍රියාමාර්ගයක් ගැනීමට පෙර වෘත්තීය උපදෙස් ලබාගත යුතු ය.

## අන්තර්ගතය


**1. ජනතාවගේ අයිතිවාසිකම් සහ බලතල** **01**

1.1 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 01

1.2 විධායක බලතල යනු? 01

1.3 පොලිස් බලතල යනු කුමක් ද? 01

1.4 ශ්‍රී ලංකා පොලිසියේ කාර්යභාරය? 02

**2. පොලීසිය විසින් කරනු ලබන සෝදිසි කිරීම්** **03**

2.1 යම් ස්ථානයක් සෝදිසි කිරීමට පොලීසියට බලය තිබේ ද? 03

2.2 මා සතු දේපළක් පොලීසිය විසින් සෝදිසි කිරීමේ දී මා සතු අයිතිවාසිකම් මොනවා ද? 03

2.3 එසේ සෝදිසි කිරීමේ දී යමක් රැගෙන යා හැකි ද? 03

2.4 එසේ රැගෙන යන දෙයකට කුමක් සිදුවේ ද සහ මම එය නැවත ලබාගන්නේ කෙසේ ද? 03

2.5 ස්ත්‍රියකගේ ශරීරය පරීක්ෂා කළ හැකි වනුයේ කාන්තා නිළධාරිනියකට පමණි ද? 04

**3. අත්අඩංගුවට ගැනීම** **05**

3.1 අත්අඩංගුවට ගැනීම යනු කුමක් ද? 05

3.2 අත්අඩංගුවට ගැනීමේ වරෙන්තුවක් යනු කුමක් ද? 05

3.3 අත්අඩංගුවට ගැනීමේ වරෙන්තුවක් නොමැතිව මා අත්අඩංගුවට ගත හැකි ද? 05

3.4 අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ දී මා හට පොලීසියෙන් විමසිය හැකි වන්නේ මොනවාද? 06

3.5 පොලීසිය විසින් මා වෙත පොලීසිය වෙත එන ලෙසට ඉල්ලා සිටියහොත් මා කුමක් කළ යුතු ද? මා යා යුතු ද? 07

3.6 පොලීසිය විසින් ප්‍රකාශයක් කිරීමේ දී මා දැනගත යුත්තේ කුමක් ද? 07

3.7 මා අත්අඩංගුවට ගෙන පොලිස් අත්තඩංගුවේ සිටින විට මගේ අයිතිවාසිකම් මොනවා ද? 07

**4. රඳවා තබාගැනීම** **09**

4.1 රඳවා තබා ගැනීම යනු කුමක් ද? 09

4.2 මා රඳවා තබා ගත හැකි වනුයේ කා හට ද? 09

4.3 මා ඕනෑම ස්ථානයක රඳවා තබා ගත හැකි ද? 09

4.4 ඇප නොමැතිව මා රඳවා තබා ගත හැකි අවස්ථා තිබේ ද? 09

4.5 මා රඳවාගෙන සිටින්නේ නම් මගේ අයිතිවාසිකම් මොනවා ද? 09

**5. ඇපය** **10**

5.1 ඇප යනු කුමක් ද? 10

5.2 මා හට ලබාදුන් ඇප අවලංගු කළ හැකි ද? 10

5.3 මා හට ඇප ලබා ගත හැකි වන්නේ කවදා ද? 11

5.4 මා හට ඇප ලබාගැනීමට අවසර නොමැති නම් කුමක් සිදුවේ ද? 11

5.5 මට ඇප ලැබීමෙන් අනතුරුව කුමක් සිදුවේ ද? 11

**6. වධහිංසාව** **12**
6.1 වධහිංසාව යනු කුමක් ද? 12
6.2 මා හට වධහිංසා පමුණුවන්නේ නම් මා හට ගතහැකි ක්ෂණික පියවරයන් කවරේ ද? 12
6.3 මට ඇති නීතිමය පිළියම් මොනවා ද? 12

**7. සමාගමයේ නිදහස** **14**
7.1 සමාගමයේ නිදහස යනු කුමක් ද? 14
7.2 මා හට හිමි සමාගමයේ නිදහස සීමා කළ හැකි වන්නේ කෙසේද? 14
7.3 මා හට මහජන විරෝධතාවයක් සංවිධානය කිරීමට හෝ සහභාගී වීමට හැකිද? 14

**8. අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස** **16**
8.1 අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස යනු කුමක්ද? 16
8.2 මගේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සීමාකළ හැකි ද? 16
8.3 මා විසින් සිහිතබාගත යුතු සෙසු සීමාවන් මොනවා ද? 17

**9. කාන්තාවන් ආරක්ෂාකරනු ලබන අපරාධ නීතිය** **18**
10. ගෘහස්ථ හිංසනය 21
10.1 ගෘහස්ථ හිංසනය යනු කුමක්ද? 21
10.2 ගෘහස්ථ හිංසනය සම්බන්ධ ආරක්ෂණ නියෝගයක් ලබාගත හැක්කේ කාහටද? 21
10.3 මට කුමන ආකාරයේ ආරක්ෂාවක් ලබාගත හැකි ද? 22
10.4 මෙම ආරක්ෂණ නියෝගයන් ලබාගන්නේ කෙසේ ද? 22
10.5 මහේස්ත්‍රාත් අධිකරණයේ ක්‍රියාවලිය කුමක් ද? 23

**11. නෛතික ප්‍රතිකර්ම** 24
11.1 පොලිස් පැමිණිල්ලක් සිදුකිරීම 24
මා විසින් පොලිස් පැමිණිල්ලක් සිදුකළ යුත්තේ කුමන ස්ථානයේ ද? 24
මාගේ නීතිඥයා හට පැමිණිය හැකි ද? 24
මා හට තෝරාගත් ඕනෑම භාෂාවකින් මා හට පැමිණිල්ලක් සිදුකළ හැකි ද? 24
මගේ පැමිණිල්ල මා විසින්ම ලියා පොලිස් පැමිණිලි පොතේ ඇලවිය හැකි ද? 24
ළමා හා කාන්තා කාර්යාංශය 25

11.2 අධිකරණයේ නඩු පැවරීම 25
නඩු පැවරීමේ ප්‍රමාදයන් නීතිය නොයිවසයි 25
රජයට එරෙහිව මා හට පැවරිය හැකි නඩු මොනවා ද? 25
මූලික අයිතිවාසිකම් 26
රිට් ආඥා 29

11.3 ස්වාධීන කොමිෂන් සභා /අධිකාරීන් 30

# 01. ජනතාවගේ අයිතිවාසිකම් සහ බලතල

## 1.1 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ජනතාවගේ ස්වෛරීත්වය පිළිබඳ සඳහන් වේ. මෙයින් අදහස් කරනුයේ රටක් පාලනය කිරීමේ බලය ලැබෙනුයේ ජනතාවගෙන් බවයි. ජනතාව,

- අපේ ජීවිත සඳහා බලපානු ලබන නීතිය සම්පාදනය කිරීමට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ඔවුන්ගේ බලය විශ්වාසයෙන් යුතුව ලබාදීම ප්‍රත්පත්තී සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සහ නීතියට අනුව පරිපාලන ආයතන පවත්වාගෙන යාම සඳහා විශ්වාසයෙන් යුතව ඔවුන්ගේ බලය පරිපාලන හා විධායක බලය ලබාදීම

- පරිපාලකයින් නීතිය තුළ වැඩකරනුයේ ද යන්න පිළිබඳ හා ජනතාවගේ අයිතිවාසිකම් උල්ලංඝණය නොකිරීම ඇතුළුව ආරවුල් පිළිබඳ තීරණය කිරීම සඳහා විනිශ්චයකාරවරුන් හට බලය ලබාදීම.

ජනතාව විසින් මෙම බලතල ලබාදෙනුයේ මෙම බලතල පුද්ගලයන් විසින් සියලු පුද්ගලයින්ගේ ජීවිත වැඩිදියුණු කර ආරක්ෂා කරනු ඇති බවත් ඔවුන් විසින් ජනතාවගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය නොකරනු ඇති බවටත් වූ විශ්වාසයෙන් යුතුව ය. පුරවැසියන් වශයෙන්, පුරවැසියකු වශයෙන්, ශ්‍රී ලංකාවේ ජනතාව වෙත මෙම බලය පවතින අතර විශ්වාසයෙන් යුතුව ඔවුන් එය ආණ්ඩුවේ ඕනෑම කොටසකට - පාර්ලිමේන්තුවට, විධායකයට හෝ අධිකරණයට විශ්වාසයෙන් යුතුව භාරදීමට ඔවුන් වගකිව යුතු ය. මෙම බලය ලබාදිය හැකි ප්‍රධාන ක්‍රමවේදය වනුයේ ඡන්දය ලබාදීමෙනි.


## 1.2 විධායක බලතල යනු?

ග්‍රාමසේවක නිලධාරියාගේ සිට ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා දක්වා රජයේ රැකියාවක් කරන සහ ජනතාවට පරිපාලනමය වශයෙන් සේවය කරනු ලබන සියලුම දෙනා විධායක නිලධාරීන් ය. ඔවුන් සියල්ලන්ම බලය භාවිත කරනුයේ එකී බලතල ජනතාව විසින් විශ්වාසයෙන් යුතුව ලබදී ඇති බැවිනි. ඔවුන් සියලුදෙනා රටේ නීතිය මගින් පාලනය වේ. විධායක නිලධාරීන් ජනතාවගේ යහපත උදෙසා කටයුතු කිරීම සහතික කිරීම සඳහා නිසි හා ප්‍රමාණවත් නීති බවට පුරවැසියන් වගබලාගත යුත්තේ මේ හෙයිනි. ඔවුන් නීති විරෝධී ක්‍රියාවක් සිදුකරයි නම් හෝ ඕනෑම පුරවැසියකුගේ මූලික අයිතිය උල්ලංඝණය කරන්නේ නම් හෝ ක්‍රියාව වෙනස් කළ යුතු අතර සමහර අවස්ථාවන්වලදී වන්දි ගෙවීමට පවා නියෝග කිරීමට අධිකරණයට බලය ඇත.

## 1.3 පොලිස් බලතල යනු?

ශ්‍රී ලංකා පොලීසිය විධායකයේ කොටසකි. මෙමගින් අදහස් වනුයේ පොලීසිය භාවිත කරන බලය ජනතාව විසින් ලබාදී ඇති බවයි. පොලිස් නිලධාරීන් ඔවුන්ගේ වැඩකටයුතු (ජනතාව විසින් අනුමත කර ඇති පරිදි) නීතියට අනුව සිදුකළ යුතු ය. ඔවුනට ජනතාවගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කළ නොහැකි ය. පොලිසිය පිළිබඳ දැඩි පරීක්ෂාකිරීම් දෙකකි - නීතිය හා අධිකරණය. පුරවැසියන් පොලීසිය කෙරේ නිසි සැළකිල්ලෙන් පසුවේ නම් ඔවුන් විසින් පොලීසිය පිළිබඳ පවතින නීතින් වැඩිදියුණු කරන ලෙසට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිය යුතු ය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වනුයේ ජනතාවගේ යහපත උදෙසා කටයුතු කිරීම සඳහා ජනතාව විසින් විධායකය වෙත බලය ලබාදෙන බවයි. ශ්‍රී ලංකා පොලීසිය විධායක ක්ෂේත්‍රයේ එක් ආයතනයකි.




## 1.4 ශ්‍රී ලංකා පොලීසියේ කාර්යභාරය කුමක්ද?

- පොලීසිය පුරවැසියන් සමගින් ගනුදෙනු කරනු ලබයි. ඔවුන්ගේ වගකීම වනුයේ නීති බලාත්මක කිරීම, අපරාධ විමර්ශනය කිරීම, පුරවැසියන් වෙත උද්ගත වන හදිසි අවස්ථාවන්හි දී ප්‍රතිචාර දැක්වීම හා පුරවැසියන්ට උපකාරක සේවා සැපයීම ය. යහපත් පොලිස් බලකායක් සිටින විට සියලුම පුරවැසියන් හට ආරක්ෂාකාරී හැඟීම් උද්ගත වනු ඇත.


- ශ්‍රී ලංකා පොලිස් සේවයේ දැක්ම වනුයේ **අපරාධ හා ප්‍රචණ්ඩත්වය පිළිබඳ බියකින් තොරව විශ්වාසයෙන් යුතුව ජීවත්වීමට හැකි සාමකාමී පරිසරයක් බිහිකිරීම** යනුවෙනි. මෙහින් අදහස් කරනුයේ ඔවුන් ගෞරවණීය, හිංසාවෙන් තොර විය යුතු අතර සියලු පුරවැසියන් හට බියෙන් තොරව ජීවත් විය හැකි පරිසරයක් තිබෙන බව සහතික විය යුතු බවයි.

- කිසිදු පුද්ගලයෙකු වෙත දඬුවම් කිරීම සඳහා ඔවුනට බලය ලබා දී නොමැත. පුද්ගලයන් හට දඬුවම් කළ හැකි වනුයේ අධිකරණයට පමණි.

හමුදා බලකායන් යුධ කාල සීමාවන්හි දී ක්‍රියාකාරීව කටයුතු කරනු ලබයි.රටෙහි සතුරන්ට එරෙහිව සටන් කිරීම සඳහා ඔවුන් පුහුණු කරනු ලැබේ. හමුදා බලකායන්ගේ වෙනස් පුහුණුවක් ලබන හෙයින් පුරවැසියන් සමගින් සෘජුව සම්බන්ධ වීම යහපත් භාවිතයක් නොවේ.

# 02. පොලිසිය විසින් සිදුකරනු ලබන සෝදිසි කිරීම්.

## 2.1 යම් ස්ථානයක් සෝදිසි කිරීමට පොලිසියට බලය තිබේද?



1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ජනතාවගේ ස්වෛරීත්වය පිළිබඳ සඳහන් වේ. මෙයින් අදහස් කරනුයේ රටක් පාලනය කිරීමේ බලය ලැබෙනුයේ ජනතාවගෙන් බවයි. ජනතාව,

- සාමාන්‍යයෙන් පොලීසිය වෙත ස්ථානයක්
  සෝදිසි කිරීම සඳහා මහේස්ත්‍රාත්වරයෙකු නිකුත් කරනු ලබන සෝදිසි වරෙන්තුවක් ස්ථානයක් පරීක්ෂා කිරීමේ දී අවශ්‍ය වේ.
- පොලිසිය වෙත එවන් අවසරයක් නොමැති නම්, ඔබව හෝ ඕනෑම ස්ථානයක් සෝදිසි කිරීමට ඔබේ අවසරය ඊට අවශ්‍ය වේ.
- සෝදිසි වරෙන්තුවක් නොමැතිව සහ ඔබගේ අවසරයකින් තොරව පොලීසියට ඔබ හෝ ඔබේ ස්ථානය සෙවිය හැකි වනුයේ පහත සඳහන් තත්ත්වය තුළ පමණි.

ත්‍රස්ත ක්‍රියාවක් මත සැක කිරීම හේතුවෙන් සහ ත්‍රස්තවාදී වැළැක්වීමේ පනත මගින් ලබාදී ඇති යම් බලතල යටතේ හෝ හදිසි අවස්ථා රෙගුලාසි යටතේ ඔවුනට ලබා දී ඇති බලතල යටතේ ඔවුන් එම ස්ථානය සෝදිසි කරන බව ඔවුන් පවසයි නම් පමණි. එවන් සෙවීමක් කළ හැකි වනුයේ පොලිස් අධිකාරීවරයෙකුට ඉහළ නිලයක් දරන නිලධරයෙක්ට හෝ එවන් උසස් නිලධාරියෙකු විසින් පොලිස් උප පරීක්ෂකවරයෙක්ට හෝ උසස් නිලයක් දරන නිලධරයෙක් වෙත බලතල ලබාදුනහොත් පමණි.

## 2.2 මා සතු දේපලක් පොලීසිය විසින් සෝදිසි කිරීමේදී මා සතු අයිතිවාසිකම් මොනවාද?

- සෝදිසි කිරීමට හේතු දැනගැනීමට ඔබට අයිතිය ඇත.
- සෝදිසි කිරීම සිදුකරන අතරතුර දී ඔබට දේපළෙහි රැඳී සිටීමට අයිතිය ඇත.

## 2.3 එසේ සෝදිසි කිරීමේදී යමක් රැගෙන යා හැකිද?

අපරාධයක 'සාක්ෂි' ලෙස සැළකෙන කිසිවක් පොලීසිය සොයාගන්නේ නම්, ඔවුන් හට එය රැගෙන යා හැකි ය. එය සාක්ෂි නොවේනම්, ඔබේ බඩු බාහිරාදිය ඔබ වෙත භාරදීම පොලීසියේ වගකීම යි.

## 2.4 එසේ රැගෙන යන දෙයකට කුමක් සිදුවේද සහ මම එය නැවත ලබා ගන්නේ කෙසේද?

එකී භාණ්ඩය අපරාධයක් පිළිබඳ සාක්ෂියක් වන්නේ නම්, එම අයිතමය සාක්ෂි වල කොටසක් බව පොලීසිය විසින් මහේස්ත්‍රාත් අධිකරණය වෙත දැනුම් දිය යුතු අතර , නඩු විභාගය තෙක් එකී භාණ්ඩය පොලීසිය භාරය තබාගනු ඇත.

අදාළ අපරාධයේ සාක්ෂි වල කොටසක් නොවේ නම් හෝ අපරාධයකට කිසිදු සම්බන්ධයක් නොමැති නම්, ඔබට එම භාණ්ඩය ආපසු ලබාදෙන ලෙස ඉල්ලා සිටිය හැකි ය.

එය ආපසු ලබා නොදුනහොත්, ඔබේ පුද්ගලික භාණ්ඩ පොලීසිය විසින් කිසිදු හේතුවකින් තොරව රඳවාගෙන තබාගතහොත් එකී පොලිස් ස්ථානයට පැමිණිලි කළ හැකි අතර වඩාත් සුදුසු වනුයේ

ඔබට එය ප්‍රදේශයේ පොලිස් නිලධාරියාට හෝ ඔබේ ප්‍රදේශයේ සහකාර පොලිස් අධිකාරීවරයාට හෝ පොලිස්පතිවරයාට දැනුම් දිමයි. ඔබට එරෙහිව නඩුවක් තිබේ නම්, ඔබේ භාණ්ඩ ආපසු ලබාදෙන ලෙසට පොලීසියට නියෝගයක් ලබාදෙන ලෙසට අධිකරණයෙන් ඉල්ලීමක් කරන ලෙසට ඔබේ නීතිඥවරයාගෙන් ඉල්ලීමක් කළ හැකි ය.

## 2.5 ස්ත්‍රියකගේ ශරීරය පරීක්ෂා කළ හැකි වනුයේ කාන්තා නිළධාරිනියකට පමණි ද?

විනීතභාවය කෙරේ දැඩි සැළකිල්ලක් දක්වමින් කාන්තා නිලධාරිනයකට පමණක් කාන්තාවක් පරීක්ෂා කළ හැකි වන බව නීතිය පෙන්වා දි ඇත.

# 03. අත්අඩංගුවට ගැනීම

## 3.1 අත්අඩංගුවට ගැනීම යනු කුමක්ද?



ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පුද්ගලික නිදහස සඳහා ඔබට මූලික අයිතිවාසිකමක් පවතී. නමුත් එය සීමා රහිත අයිතිවාසිකමක් නොවේ. එබැවින් ඔබ විසින් අපරාධයක් කළහොත් අත්අඩංගුවට ගත හැකි ය. නමුත් නීතිමය හේතුවක් නොමැතිව සහ විධිමත් ක්‍රමවේදයකින් තොරව ඔබව අත්අඩංගුවට ගැනීමෙන් වැළකීමට ඔබට අයිතියක් ඇත.

පුද්ගලයෙකු අත්අඩංගුවට ගත හැකි වනුයේ:

- පොලිස් නිලධාරියෙකු හට
- පෞද්ගලික තැනැත්තෙක් හට පුද්ගලයෙක් අත්අඩංගුවට ගත හැකි වනුයේ එකී තැනැත්තා වරදක් කර ඇති බවට විශ්වාස කිරීමට සාධාරණ හේතුවක් තිබේ නම් සහ රඳවාතබාගත හැකි වනුයේ පොලිසිය පැමිණෙන තෙක් හෝ සැකකරු වහාම පොලිස් ස්ථානයකට භාරදෙනු ලබනතෙක් පමණි.

## 3.2 අත්අඩංගුවට ගැනීමේ වරෙන්තුවක් යනු කුමක්ද?

අත්අඩංගුවට ගැනීමේ වරෙන්තුවක් යනු අත්අඩංගුවට ගැනීමකට අවසර දීම සඳහා විනිසුරුවරයෙකු විසින් නිකුත් කරනු ලබන ලියවිල්ලකි. අත්අඩංගුවට ගැනීමේ වරෙන්තුවක පහත තොරතුරු අන්තර්ගත වේ.

- වරෙන්තුව නිකුත් කරන මහේස්ත්‍රාත් අධිකරණයේ නම
- අත්අඩංගුවට ගැනීම සිදුකරන පුද්ගලයාගේ නම හා තනතුර
- අත්අඩංගුවට ගත යුතු පුද්ගලයාගේ නම සහ ලිපිනය
- ඔහු හෝ ඇය අත්අඩංගුවට ගැනීමට සම්බන්ධ සිද්ධිය පිළිබඳ විස්තර
- එකී පුද්ගලයා විසින් සිදුකරන ලද වරද හා එකී චෝදනාව සම්බන්ධයෙන් වූ දඬුවම් වගන්තිය
- වරෙන්තුවේ නම් කර ඇති පුද්ගලයා අත්අඩංගුවට ගැනීමේ නියෝගය
- වරෙනතුව නිකුත් කරනු ලබන විනිසුරුවරයාගේ අත්සන සහ දිනය

## 3.3 අත්අඩංගුවට ගැනීමේ වරෙන්තුවක් නොමැතිව මාව අත්අඩංගුවට ගත හැකි ද?

වරෙන්තුවක් නොමැතිව පොලීසියට පහත අවස්ථාවන්හි දී පමණක් ඔබව අත්අඩංගුවට ගත හැකි ය.

- වරෙන්තුව නිකුත් කරන ලද පුද්ගයා ඔබ බවට පොලීසිය සාධාරණව විශ්වාස කරන්නේ නම්, ඔවුන්ට ඔබව අත්අඩංගුවට ගනු ලබන අවස්ථාවේ දී ඔවුන් සතුව වරෙන්තුව නොමැති වුව ද ඔබව අත්අඩංගුවට ගත හැකි ය.
- ඔබ වරදක් කිරීමට උත්සාහ කරනු ලබන බව පොලීසියට දැකගත හැකි නම් සහ ඔබව නැවැත්වීමට ඇති එකම ක්‍රමය ඔබව අත්අඩංගුවට ගැනීම නම් එවන් අවස්ථාවක දී

- පොලිස් නිලධාරියෙකු ඉදිරියේ වරද සිදුකර තිබේනම් සහ ඔබ විසින් නම සහ ලිපිනය ලබාදීම ප්‍රතික්ෂේප කරන්නේ නම් හෝ තොරතුරු වැරදියි කියා විශ්වාස කිරීමට පොලිස් නිලධාරියා වෙත හේතු තිබේනම් , ඔබේ නම ලිපිනය ලබාගැනීම සඳහා වරෙන්තුවක් නොමැතිව ඔබව අත්අඩංගුවට ගත හැකි ය.
- පොලිස් ස්ථානයක දී ඔබට විරුද්ධව පැමිණිල්ලක් කර තිබේ නම් හෝ ඔබ විසින් වරදක් කර ඇති බවට අතිශය විශ්වාසදායක තොරතුරු තිබේනම්
- ඔබ විසින් පොලිස් නිලධාරියකුගේ නිල රාජකාරියට බාධා කරනු ලබයි නම්
- ඔබ විසින් ඔබගේ පෙනීසිටීම සැඟවීමට උත්සාහ කර ඇත්නම් සහ ඔබ වරදක් කර සැඟවී සිටින බවක් පෙනේ නම්, ඔබ අත්අඩංගුවට ගත හැකිය
- ඔබ ජීවත් වන්නේ ශ්‍රී ලංකාවේ නම් සහ ඔබ වෙන රටක වරදක් වන දෙයක් මෙන්ම ශ්‍රී ලංකාවේ ද වරදක් වන ක්‍රියාවක් සිදුකර ඇත්නම් , ඔබව අත්අඩංගුවට ගෙන ඔබ එම වරද කළ රටට පිටුවහල් කළ හැකි ය. මෙය සිදුකරනුයේ ඔබ වරදක් කළ රට තුළ ඔබට චෝදනා ගොනු කර නඩු පැවරීම සඳහා ය.

අත්අඩංගුවට ගනු ලැබුවහොත් පොලීසිය විසින් සාමාන්‍යයෙන් ඔබව පැය 24ක් තුළ මහේස්ත්‍රාත්වරයෙක් වෙත ඉදිරිපත් කළ යුතු ය. ඔබව මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියට ඉදිරිපත් කිරීමට පෙර අත්අඩංගුවේ වැඩි කාලසීමාවක් තබා ගැනීමට ඉඩදෙනු ලබන නීති කිහිපයක් පවතී. වැඩි විස්තර සඳහා පහත වගුව බලන්න.

| නීතිය | අත්අඩංගුවට හෝ රඳවා තබාගනු ලබන විධිය | මහේස්ත්‍රාත්වරයෙකු වෙත ඉදිරිපත් නොකර මා රඳවා තබාගත හැකි කාලසීමාව |
|---|---|---|
| අපරාධය | වරෙන්තු සහිතව අත්අඩංගුවට ගත හැකි වැරදි | පැය 24 ක් ඇතුළත |
| | වරෙන්තු නොමැතිව අත්අඩංගුවට ගත හැකි වැරදි | ප්‍රමාදයකින් තොරව සහ පැය 24 ක් තුළ |
| ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත | ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සිදුකරන ලද වරදක් | පැය 72 ක් තුළ |
| | අත්අඩංගුවට ගෙන රඳවා තබා ගැනීම සඳහා අමාත්‍යවරයා විසින් රැඳවුම් නියෝගයක් නිකුත් කරනු ලබයි | මහේස්ත්‍රාත්වරයෙක් ඉදිරියට පමුණුවීම සඳහා කිසිදු අයිතියක් නැති අතර මාස 3 ක් රඳවා තබා ගත හැකි ය. (උපරිම රැඳවුම් කාලය මාස 18 කි) |

## 3.4 අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ දී මා හට පොලීසියෙන් විමසිය හැකි වන්නේ මොනවාද?

- අදාළ නිලධාරියා අනුයුක්ත කර ඇති නම, නිලය සහ පොලිස් ස්ථානය විමසිය හැකිය.
- ඔබ අත්අඩංගුවට ගනු ලබන වරද හෝ අපරාධය කුමක්දැයි ඔබට විමසිය හැකිය.
- ඔබව සැක කරන අපරාධය ඔබට තේරුම් ගත හැකි භාෂාවකින් පැහැදිලි කර දෙන ලෙස ඔබට ඉල්ලා සිටිය හැකිය.

## 3.5 පොලීසිය විසින් මා වෙත පොලීසිය වෙත එන ලෙසට ඉල්ලා සිටියහොත් මා කුමක් කළ යුතු ද? මා යා යුතු ද?

ඒ සඳහා හේතු නොදක්වා පොලීසිය වෙත එන ලෙසට ඔබෙන් ඉල්ලීමක් කළ නොහැකි ය. ඔබ අත්අඩංගුවේ පසුවේ නම් පමණක් පොලීසියට ඔබව මැඩපවත්වා රැගෙන යා හැකි ය.

ඔබ අත්තඩංගුවේ පසුවේ නම් ඔබට පහත අයිතීන් ඇත.

- ඔබව පොලිසියෙන් ගෙනයාමට ඉල්ලා සිටිනුයේ මන්දැයි පොලිසියෙන් විමසීමට.
- ඔබට යා හැකි කාලය හා දිනය තිරණය කිරීමට.
- ඔබ එසේ යනු ලබන අවස්ථාවේ දී පොලිස් ස්ථානයේ දී ඔබට සහය වීම සඳහා නීතිඥයකු හෝ වෙනත් යම් තැනැත්තකු ඔබ සමග යා හැකි ය.

## 3.6 පොලීසිය විසින් ප්‍රකාශයක් කිරීමේ දී මා දැනගත යුත්තේ කුමක් ද?

- ඔබ ලබාදෙන ප්‍රකාශය ඔබට තේරුම්ගත හැකි භාෂාවකින් ලියා තිබෙන බව ඔබට විමසිය හැකි ය. ඔබ ප්‍රකාශය අවසානයේ ඔබේ අත්සන තැබූ විට ලියා ඇති ප්‍රකාශයේ හරියටම ඔබ පැවසූ දේ ඇති බව ඔබට විශ්වාසයි.
- එම ප්‍රකාශය වෙනත් භාෂාවකින් ලියා තිබුණහොත් ඔබට තේරෙන භාෂාවකින් එය පැහැදිලි කරන ලෙස ඔබට ඉල්ලා සිටිය හැකිය.
- යමකු ඔබ සමග රැගෙන යාම ප්‍රයෝජනවත් වේ. ඔබ වෙනුවෙන් කථා කළ හැකි මිතුරකු, පවුලේ සාමාජිකයකු හෝ නීතිඥයකු රැගෙන යා හැකි අතර,ප්‍රකාශය ලිවීමට ඉඩඇති භාෂාව කතාකළ හැකි පුද්ගලයකු වඩාත් සුදුසු වන අතර ඔහුට එකී ප්‍රකාශය පරීක්ෂා කළ හැකි ය.
- ඔබ ප්‍රකාශයක් කර නොමැති නම් සහ ලේඛණයට අත්සන් කිරීමට ඔබෙන් ඉල්ලා සිටී නම් , එය කුමක්දැයි විමසීමට ඔබට අයිතියක් ඇති අතර එය අත්සන් කිරීමට ඔබ එකඟ නොවන්නේ නම්, ඔබට එය අත්සන් කිරීම ප්‍රතික්ෂේප කළ හැකි ය.
- ඔබේ මහහපටැඟිල්ල හිස් කඩදාසි පත්‍රවල අත්සන් කිරීම හෝ තැබීම නොකළ යුතු ය.

## 3.7 මා අත්අඩංගුවට ගෙන පොලිස් අත්තඩංගුවේ සිටින විට මගේ අයිතිවාසිකම් මොනවා ද?

ඔබ අත්අඩංගුවට ගනු ලැබුවහොත් එයින් අදහස් වනුයේ ඔබ අපරාධයක් කරන ලද බවට සැක කරන බව සහ ඔබ අපරාධයකට වගකිව යුතු යැයි විශ්වාස කිරීමට ප්‍රමාණවත් සාක්ෂි රජයට ඇති බවත් ය.

සැකකරුවන් හට අයිතිවාසිකම් රාශියක් ඇත, මන්ද ඔවුන් වැරදිකරු බව අධිකරණය තීන්දු කරන තුරු ඔවුන් නිර්දෝෂී පුද්ගලයන් වශයෙන් සැළකිය යුතු බැවිනි.

- අමානුෂික හෝ අවමන් සහගත සැළකීම් නොකිරීම හෝ වධහිංසාවන්ට ලක් නොවී සිටීමට ඔබට අයිතියක් ඇත. ඔබට ද කිසිදු ආකාරයෙන් දඬුවම් පැමිණිවීමක් සිදුකළ නොහැක. දඬුවම් නියම කළ හැකි වනුයේ උසාවියකට පමණි.

- ඔබගේ පවුලේ සාමාජිකයන් හට ඔබව බැලීමට පැමිණිය හැකි ය.
- නීතිඥයකු හට ඔබ වෙත පැමිණීමට, කථා කිරීමට සහ උපදෙස් දීමට අයිතිය ඇත. මෙම අයිතිය කිසිවකුගේ මැදිහත්වීමකින්/අධීක්ෂණයකින් තොරව ලබාගත යුතු අයිතියකි.
- මහේස්ත්‍රාත්වරයෙක් වෙත පැමිණවීමට ඔබට අයිතිය ඇත.

# 04. රඳවා තබාගැනීම



## 4.1 රඳවා තබා ගැනීම යනු කුමක්ද?

රඳවා තබා ගැනීමක් යනු පොලිස් නිලධාරියෙකු හෝ වෙනත් රජයේ නිලධාරියෙකු විසින් ඔබව අත්අඩංගුවේ තබාගෙන සිටීමයි.

## 4.2 මා රඳවා තබාගත හැකි වනුයේ කා හට ද?

ඔබව අත්අඩංගුවට ගනු ලැබූ වේලාවේ සිට මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලබන කාලය දක්වා ඔබව පොලිස් අත්තඩංගුවේ (සාමාන්‍යයෙන් පැය 24 ක කාලසීමාවක්) රඳවා තබාගත හැකි ය. නමුත් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගතහොත් ඔබව ඊට වඩා වැඩි කාලයක් රඳවා තබාගත හැකි ය.

ඔබව මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබීමෙන් අනතුරුව, ඔබව තවදුරටත් රඳවා තබාගැනීමට හේතු තිබේ ද යන්න විමසා බැලීම මහේස්ත්‍රාත්වරයාගේ කාර්යය වේ. ඔබව රඳවා තබා ගැනීම සඳහා සාධාරණ හේතු තිබේ යැයි මහේස්ත්‍රාත්වරයා විශ්වාස කරයි නම්, බොහෝවිට වැඩිදුර විමර්ශණ කටයුතු සඳහා ඔබව රිමාන්ඩ්භාරයේ තබාගනු ඇත.

## 4.3 මා ඕනෑම ස්ථානයක රඳවා තබා ගත හැකි ද?

නොහැකි ය. මහේස්ත්‍රාත්වරයා විසින් ඔබව රඳවාතබාගැනීමට නියෝග කළහොත් බන්ධනාගාර දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ස්ථානයක පමණක් ඔබව රඳවා තැබිය හැකි ය. ඔබව නැවතත් පොලිස් අත්අඩංගුවට ගෙන යා නොහැකි ය.

නමුත් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රිමාන්ඩ් බන්ධනාගාරගතව සිටින තැනැත්තකු පොලිස් විමර්ශන සඳහා ඉවතට ගත හැකි වේ.

## 4.4 ඇප නොමැතිව මා රඳවා තබා ගත හැකි අවස්ථා තිබේ ද?

ඔබව මනුෂ්‍යඝාතනයක් හෝ ත්‍රස්තවාදය සම්බන්ධ වරදක් යටතේ අත්තඩංගුවට ගතහොත් ඇප ලබානොදී රඳවා තබාගත හැකි ය.

## 4.5 මා රඳවාගෙන සිටින්නේ නම් මගේ අයිතිවාසිකම් මොනවා ද?

ඔබ රඳවා තබාගැනීමක දී සහ අධිකරණයේ නඩුව අවසන් වනතුරු ඔබ සැකකරුවකි. සැකකරුවන් හට අයිතිවාසිකම් කිහිපයක් තිබේ. මන්ද පුරවැසියන් වැරදිකරුවන් බව ඔප්පු වනතුරු ඔවුන් නිර්දෝෂී පුද්ගලයන් වශයෙන් සැළකිය යුතු ය. මෙම අයිතීන් පහත පරිදි වේ.

- නීතිඥයකු ලබාගැනීම
- සාධාරණ නඩු විභාගයක් ලබාගැනීම
- වධහිංසාවෙන් නිදහස
- අමානුෂික හා අවමන් සහගත සැළකිල්ලකට ලක් නොවීමට
- සිතීමේ හා හෘද සාක්ෂියේ නිදහස
- ඕනෑම ආගමක් ඇදහීමට හා අනුගමනය කිරීමේ නිදහස

# 05. ඇපය

## 5.1 ඇපය යනු කුමක් ද?

ඇප ලබාදීමට (ඇප තැබීමකින් පසුව) අධිකරණයට අවසර දිය හැකියාව ඇති අතර ඔබව බන්ධනාගාරයෙන් නිදහස් කිරීම සඳහා අධිකරණයට හැකි ය. ඔබ විසින් අධිකරණයේ දෙන සහතිකය නම් ඔබ නඩු විභාගය සඳහා පෙනී සිටින බවයි.

පහත දැක්වෙන ඕනෑම ආකාරයකින් ඇප ලබාදීමට අධිකරණයට ඔබට ඉඩදිය හැකි ය.

- බැඳුම්කරය - බැඳුම්කරයක් යනු චූදිත පුද්ගලයා වෙනුවෙන් ඇප මත මුදා හැරීමට ඇපකරුවකු විසින් ගෙවනු ලබන මුදලකි. ඇප මත මුදා හරිනු ලබන පුද්ගලයා අධිකරණය වෙත නොපැමිණියේ නම්, අධිකරණය එම මුදල නැවත ලබානොදෙන අතර එය රජය සතුකරනු ලබයි.
- ඇපකරු - ඔබ අධිකරණය වෙත පැමිණීමේ වගකීම වෙනත් පුද්ගලයකු විසින් ගනු ලබයි.
- වෙනත් කොන්දේසි

ඇප කොන්දේසි නියම කිරීමට පෙර අධිකරණය පහත කරුණු සළකා බලනු ලබයි.


- විත්තිකරු නැවත අධිකරණය වෙත නොපැමිණීමේ අවදානම
- චෝදනා කරන ලද අපරාධයේ ස්වභාවය
- අපරාධකරුගේ අන්තරයාකරබව
- මහජන ආරක්ෂාව

## 5.2 මා හට ලබාදුන් ඇප අවලංගු කළ හැකි ද?

ඔබ ඇප මත මුදාහැරීමේ දී පනවන ලද යම් කොන්දේසියක් කඩකර ඇත්නම් හෝ පොරොන්දු වූ පරිදි අධිකරණය ඉදිරියේ පෙනී සිටීමට ඔබ අපොහොසත් වුවහොත් ඔබව ඇප මත මුදා හැරීමේ නියෝගය අවලංගු කළ හැකි ය.

## 5.3 මා හට ඇප ලබා ගත හැකි වන්නේ කවදා ද?

ඔබට ඇප ලබාගත හැකි වනුයේ කවදාද සහ කෙසේද යන්න රඳා පවතිනුයේ ඔබට චෝදනා කරනු ලබන වරද ඇප ලබාදිය හැකි වරදක්ද හෝ ඇප දිය නොහැකි වරදක්ද යන්න මත වේ.





## 5.4 මා හට ඇප ලබාගැනීමට අවසර නොමැති නම් කුමක් සිදුවේ ද?

ඔබව රිමාන්ඩ් බන්ධනාගාරයේ තබනු ඇත. මෙමගින් අදහස් වනුයේ ඔබේ මීළඟ උසාවි දිනය දක්වා ඔබව බන්ධනාගාරයක රඳවා තබන බවයි.

## 5.5 මා හට ඇප ලැබීමෙන් අනතුරුව කුමක් සිදුවේ ද?

ඔබ ඇප ලබාදීමෙන් පසු රිමාන්ඩ් බන්ධනාගාරයෙන් නිදහස් (ඇප බැඳුම්කරය අත්සන්කිරීම හෝ ඇපකරුවකු ඉදිරිපත් කිරීමෙන් අනතුරුව) වනු ඇති අතර ඔබට නියෝග කරනු ලබන සෑම අවස්ථාවකදීම ඔබ අධිකරණය ඉදිරියේ පෙනී සිටිය යුතු ය.

# 06. වධහිංසාව



## 6.1 වධහිංසාව යනු කුමක් ද?

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ, ශ්‍රී ලංකාවේ සියලුම පුද්ගලයින් හට අමානුෂික හා අවමන් සහගත සැළකීම්වලින් නිදහස ලැබීම සහතික කිරීම සඳහා සියලු රාජ්‍ය නිලධාරීන් හට බැඳීමක් තිබේ.

වධහිංසාවක් යනු වෙනත් රජයේ සේවකයෙකු විසින් පුද්ගලයකු වෙත ශාරීරික හෝ මානසික පීඩාවක් ගෙන දෙනු ලබන ඕනෑම ක්‍රියාවක්,යම් පුද්ගලයකුගෙන් පාපොච්චාරණයක් හෝ තොරතුරක් ලබාගැනීම සඳහා සිදුකරන ලද, සැක සහිත ක්‍රියාවක් සඳහා යම් පුද්ගලයකු වෙත දඬුවම් කිරීම, යමකු බිය ගැන්වීම හෝ බලකිරීම, ඔවුන්ගේ අනන්‍යතාවය හේතුවෙන් යමකු වෙත වෙනස් කොට සැළකීම යනාදිය වේ.

ශාරීරික වධහිංසා සඳහා උදාහරණ - කම්මුලට ගැසීම, පහරදීම, පයින් ගැසීම, පෑගීම, ස්ත්‍රී දූෂණය, ලිංගික අපයෝජනය සහ හිරිහැර කිරීම, බැටන්, කූරු, දර, පොලු හෝ කඩුලු,වයර් සහ ලෝහ දම්වැල් වැනි දෑ භාවිත කිරීම මගින් වේදනාව ඇති කරවීම, පාදවලට පහරදීම, මහපටැඟිලි, මැණික් කටුව හෝ වළලුකර මගින් එල්ලා තැබීම, පිළිස්සීම, මිරිස් කුඩු හෝ පෙට්‍රල් භාවිත කිරීමෙනන් හුස්ම හිරකිරීම සහ නාසය වෙත ඇල්ලීම, විවිධ පීඩාකාරී සංවේදීනයන් හා විදුලි කම්පන ඇති කරලීම

මානසික වධහිංසාවන් සඳහා උදාහරණ - බිය උපදවන හෝ සිතේ වේදනාවක් ඇති කරවන රළු භාෂාව, නින්දාසහග වචන, හිරිහැර කිරීම්, තර්ජන, අපහාස, ඇඳුම් ඉවත් කිරීම, ලිංගික වශයෙන් සිදුකරනු ලබන මානසික හිංසනයන්

ඉහත සඳහන් දෑ උදාහරණ පමණකි. සැළකීමේ ස්වභාවය හා තත්ත්වය අනුව, එය දරුණු වේදනාවක් ඇති කරයි නම් , වෙනත් ක්‍රියාවන් මගින් ද වධහිංසා පැමිණවිය හැකි ය.

## 6.2 මා හට වධහිංසා පමුණුවන්නේ නම් මා හට ගතහැකි ක්ෂණික පියවරයන් කවරේ ද?

- ඔබේ තුවාල සඳහා වහාම වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීමට අවශ්‍ය වේ
- සිදු වූ දේ පිළිබඳව සියලු සාක්ෂි ඔබ විසින් තබා ගත යුතු ය. තුවාල වල ඡායාරූප, වෛද්‍ය සාක්ෂි, සාක්ෂිකරුවන්ගේ තොරතුරු යනාදිය
- වහාම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් කළ යුතු ය.

## 6.3 මට ඇති නීතිමය පිළියම් මොනවා ද?

ඔබට ලබාගත හැකි නීතිමය පිළියම් වර්ග 4කි

### (i) ඒ පිළිබඳව පොලිසිය වෙත පැමිණිලි කිරීම

රාජ්‍ය නිලධාරියකු විසින් වධහිංසා පැමිණවීම හෝ අමානුෂික හා පහත් ලෙස සැළකීම සාපරාධී වරදකි. වධහිංසා පැමිණවීම පිළිබඳව අධිකරණයකින් වැරදිකරු බව ඔප්පු වුවහොත් රජයේ නිලධාරියෙකු හට අවුරුදු හතක් හෝ දහයක් අතර බරපතල නොවන හෝ බරපතල වැඩ සහිත සිරදඬුවමක් නියම කළ හැකි ය. ඔබ විසින් වධහිංසා පැමිණවීම පිළිබඳව පොලිස් පැමිණිල්ලක්

කළ අවස්ථාවේ දී , ප්‍රකාශයක් ලබාදීමෙන් සහ අධිකරණයේ පැවැත්වෙන නඩුවිභාගයක දී සාක්ෂි ලබාදීම මගින් විමර්ශනයට ඔබට සහභාගී විය හැකි ය.

### (ii) ශ්‍රේෂ්ඨාධිකරණයේ පැමිණිල්ලක් ගොනු කිරීම

- වධහිංසා පැමිණවීම, අමානුෂික හා පහත් ලෙස සැළකීම අපගේ ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීමකි. සිද්ධිය සිදු වී දින 30 ක් ඇතුළත ඔබ විසින් නඩු පැවරිය යුතු ය. එකී කාලසීමාව සඳහා පවතින එකම ව්‍යතිරේකය වනුයේ ඔබ දින 30ක් ගතවීමට පෙර ශ්‍රී ලංකා මානව හිමිකම් කවුන්සිලය ඉදිරියේ පැමිණිල්ලක් ගොනුකර තිබීම හෝ ඔබේ පැමිණිල්ල මානව හිමිකම් කවුන්සිලයේ විභාග වෙමින් පවතී නම් පමණි.

- ශ්‍රේෂ්ඨාධිකරණය හට ඔබේ නඩුව විභාග කළ හැකි අතර,විධහිංසා පැමිණ ඇති බව තීරණය කළහොත්, වගකිව යුතු පුද්ගලයින් විසින් ඔබගේ අයිතිවාසිකම් උල්ලංඝණය කර ඇති බව නෛතික වශයෙන් පිළිගනිමින් අධිකරණ තීන්දුවක් ලබාදෙනු ඇත.එමෙන්ම අධිකරණය විසින් වගකිවයුත්තන් සහ රජය විසින් ඔබට ගෙවිය යුතු වන්දි මුදලක් ලබාදීමට ද තීරණය කළ හැකි ය.

### (iii) වගකිවයුතු පුද්ගලයන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ඉල්ලා පැමිණිල්ලක් කිරීම

- ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිලි කිරීම

- වධහංසා පැමිණවීමට හෝ අයහපත් ලෙස සැළකීමට වගකිව යුතු පුද්ගලයා පොලිස් නිලධාරියෙක් නම්, ඔබට ජාතික පොලිස් කොමිසමට පැමිණිල්ලක් ද ඉදිරිපත් කළ හැකි ය.

### (iv) සිවිල් ක්‍රියාමාර්ගයක් ගැනීම (වන්දි සඳහා)

- වධහිංසා පැමිණවීම හෝ අයුතු ලෙස සැළකීම සම්බන්ධයෙන් වගකිව යුතු රාජ්‍ය නිලධාරීන්ට එකී රජයේ නිලධාරියා සිටින ප්‍රදේශයේ දිසා අධිකරණයේ නඩු පැවරිය හැකි ය. සිද්ධියෙන් වසර දෙකක් ගතවීමට පෙර ඔබ මෙම නඩුව ගොනු කළ යුතු ය.

- වධහිංසා පැමිණවීම හෝ අයහපත් ලෙස සැළකීම සහ මානසික හා ශාරීරික පීඩා හේතුවෙන් ඔබට සිදුවන ඕනෑම අලාභයක් හෝ හානියක් සඳහා ඔබට වන්දි ඉල්ලා සිටිය හැකි ය. මෙය ගොනු කිරීම සඳහා ඔබට නීතිඥයකුගේ සහාය ලබා ගැනීමට අවශ්‍ය වනු ඇත. ඔබට නීතිඥයකුගේ ලබාගත නොහැකි නම්, ඔබට රජය හෝ සමහර රාජ්‍ය නොවන සංවිධාන විසින් සපයනු ලබන නීති ආධාර ලබාගැනීමට අවශ්‍ය විය හැකි ය.

*(මෙම අත්පොතේ අවසාන කොටසේ පොලිස් පැමිණිලි, ශ්‍රේෂ්ඨාධිකරණ නඩු සහ ස්වාධීන කොමිෂන් සභාවල පැමිණිලි කිරීම පිළිබඳ වැඩි විස්තර ඇත.)*

# 07. සමාගමයේ නිදහස

## 7.1 සමාගමයේ නිදහස යනු කුමක් ද?



අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අපට මේ සඳහා අයිතිය ලබා දෙයි.

- සංගමයක් හෝ වෘත්තීය සමිතියක් පිහිටුවීමට හෝ සම්බන්ධ වීම
- සාමකාමී රැස්වීමක් පැවැත්වීම
- එකලාව හෝ අන්‍යයන් සමග පෞද්ගලිකව හෝ ප්‍රසිද්ධියේ තම ආගම ඇදහීම සිදුකළ හැකි ය
- නීත්‍යනුකූල රැකියාවක් හෝ ව්‍යාපාරයක් කිරීමට අන්‍යන් සමග ඇසුරු කරන්න
- පුද්ගලික හෝ පොදු වශයෙන් කණ්ඩායමකට එක්රැස්වීමේ නිදහස, සාමකාමීව විරෝධය දැක්වීමේ අයිතිය, ආගමික රැස්වීම් පැවැත්වීම සහ කණ්ඩායමේ අනෙක් පුද්ගලයින් සමඟ සමාජගත වීම මෙයට ඇතුළත් ය.

## 7.2 මාගේ සමාගමයේ නිදහස සීමා කළ හැකි වන්නේ කෙසේ ද?

මෙම නිදහස සීමා කළ හැකි අවස්ථා කිහිපයක් තිබේ. තහනම නීත්‍යනුකූල විය යුතු ය. සාමාන්‍යයෙන් සීමා කිරීමට හේතුව වන්නේ සීමාවකින් තොරව අන්‍යයන්ට හානියක් සිදුවිය හැකි වීමයි.

උදා : නීති විරෝධී රැස්වීම, නමින් සාපරාධී වරදක් තිබේ. යම් ආකාරයක ක්‍රියාවන් කිරීම සඳහා පුද්ගලයින් 5ක් හෝ වැඩි ගණනක් එක්රැස් වන අවස්ථාවකි. උදාහරණ වශයෙන්

- රජයට විරෝධී කුමන්ත්‍රණ
- නීතිය බලාත්මක කිරීම නැවැත්වීම
- යම් පුද්ගලයකුගේ දේපළ බලහත්කාරයෙන් පවරා ගැනීම සඳහා උත්සාහ කිරීම
- රජය

## 7.3 මා හට මහජන විරෝධතාවයක් සංවිධානය කිරීමට හෝ සහභාගී වීමට හැකිද?

- හැකිය, මහජන විරෝධතා සංවිධානය කිරීම හෝ සහභාගී වීම පුරවැසියකු වශයෙන් ඔබට ඔබේ අදහස්, ඔබේ අතෘප්තිය ප්‍රකාශ කිරීමට හෝ වැදගත් කරුණු මහජනතාවගේ හෝ තීරණ ගන්නන්ගේ අවධානයට යොමු කළ හැකි වන එක් ක්‍රමයකි.
- ඔබට ඕනෑම පොදු ස්ථානයක විරෝධයක් පැවැත්විය හැකි ය. ඔබ පුද්ගලික ඉඩක් භාවිත කරන්නේ නම් ඔබට පුද්ගලික අවකාශයක් භාවිත කරන්නේ නම් එකී පුද්ගලික අවකාශය හිමි පුද්ගලයාගේ අවසරය ඇති බව සහතික කර ගත යුතු ය.
- ඔබ පොදු මාර්ගයක් ඔස්සේ පාගමනක් පවත්වන්නේ නම්, ආරක්ෂාව සහ රථවාහන කළමණාකරණය සඳහා ප්‍රමාණවත් විධිවිධාන සැළැස්විය හැකි වන පරිදි ඔබ ප්‍රාදේශීය පොලීසිය වෙත දැනුම් දිය යුතු ය. සාමකාමී විරෝධය දැක්වීමට ඔබට ඇති අයිතිය සඳහා සහාය සැළසීම පොලීසියේ යුතුකමකි.

- විරෝධතාවය අපරාධයක් වෙනුවෙන් නොවන බවත් ප්‍රචණ්ඩ නොවන බවත් ඔබ විසින් සහතික කළ යුතු ය.
- වගකිව යුතු පුරවැසියන් වශයෙන් ඔබට පහත පියවර ගත හැකි ය.
- සහභාගී වන පුද්ගලයන් සහ මහජනතාවගේ ආරක්ෂාව සහතික කිරීම.
- පොදු ස්ථානය පිරිසිදු කිරීම හා එකී ස්ථානයට හානි නොකිරීමට වග බලාගත යුතු ය.

# 08. අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස

## 8.1 අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස යනු කුමක් ද?



අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස යනුවෙන් අදහස් කරනුයේ රජයේ වාරණයකින් හෝ සීමාවකින් තොරව විවිධ කාරණා පිළිබඳ විශ්වාසයන්, සිතුවිලි, අදහස් සහ හැඟීම් ප්‍රකාශ කිරීමට පුරවැසියන් වශයෙන් අප සැමට පුද්ගලයකු හෝ කණ්ඩායමක් වශයෙන් නිදහස ඇති බවයි.

මෙය පුරවැසියන්ගේ මූලික අයිතියකි. මන්දයත් පුරවැසියන් හට රජයේ ක්‍රියාකාරීත්වය, නිසි පරිදි ක්‍රියාවේ නොයෙදෙන්නේ මන්ද සහ ජනතාවගේ අවශ්‍යතා මොනවාද යන්න පිළිබඳව රජයට පැවසීමට ඉඩ සළසන බැවිනි. මෙම මූලික නිදහස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ආරක්ෂා කර ඇත.

අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට පහත අයිතීන් ද ඇතුළත් වේ.

- අප විසින් කතා කිරීමෙන් සහ ප්‍රකාශයට පත්කිරීමෙන් හෝ ඕනෑම ආකාරයක මාධ්‍යයකින් තොරතුරු ප්‍රකාශයට පත්කිරීම හෝ විකාශ කිරීම සිදුකළ හැකි ය.
- මහජන කාර්යසාධනය සහ මහජනයා පීඩාවට පත්නොවන විරෝධතා ව්‍යාපාර
- ඕනෑම මාධ්‍යයකින් තොරතුරු ලබාගැනීම.

## 8.2 මාගේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සීමා කළ හැකි ද?

ඔව්, ඔබේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස භාවිත කිරීමෙන් හානියක් සිදුවිය හැකි අවස්ථා තිබේ. එවන් අවස්ථාවලදී නිදහස සීමා කරනු ලබන නීති කිහිපයක් තිබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පෙන්වනුයේ මෙම නිදහස පහත අවස්ථාවලදී සීමා කළ හැකි බවයි.

- ජාතික ආරක්ෂාව (උදාහරණයන් ලෙස ජනාධිපතිවරයා විසින් පනවන හදිසි නීති රෙගුලාසි).
- මහජන සාමය.
- මහජන සෞඛ්‍යය හා සදාචාරය (නිදසුනක් ලෙස නිරෝධායන නීතිය වැනි නීති මගින් මහජන සෞඛ්‍යයට අවදානමක් ඇති විය හැකි තොරතුරු හුවමාරු කර ගැනීම සම්බන්ධයෙන් පුද්ගලයන් හට සීමාවන් පැනවිය හැකි ය).
- වාර්ගික හා ආගමික සමගිය (නිදසුනක් වශයෙන් අන්‍යයන් වෙත වෙනස්කොට සැළකීම හෝ ප්‍රචණ්ඩත්වයට දිරිගන්වන අයුරින් ජාතික, වාර්ගික හෝ ආගමික වශයෙන් වෛරය සඳහා තුඩුදෙන කරුණු පෙනී සිටීම සඳහා සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය මගින් සීමා කිරීම් ඇති කරනු ලබයි)

### 8.3 මා විසින් සිහිතබාගත යුතු සෙසු සීමාවන් මොනවා ද?

- අපහාසය

යම් පුද්ගලයකුගේ කීර්ති නාමයට හානි කිරීමට ඔබ යමක් පැවසුවහොත් ඕනෑම පුද්ගලයෙක් හට ඔබට විරුද්ධව අපහාස නඩුවක් ගොනු කිරීමේ හැකියාව ඇත. ඔවන් නඩු පැවරීම සඳහා හේතුව වනුයේ ඔබ විසින් ඔවුනට හානියක් හෝ අලාභයක් සිදුකර ඇති බැවිනි. එකී හේතුව නිසා එම පුද්ගලයාට සිදුවූ හානිය සම්බන්ධව අධිකරණය වෙත පෙන්වා දිය යුතු ය. ඔබ විසින් පෙන්වාදෙනු ලබන එකී කරුණ සත්‍ය නම් හා එම තොරතුරු මහජන යහපතට හේතු වේ නම් පමණක් ඔබට ඒ සම්බන්ධයෙන් තොරතුරු ප්‍රසිද්ධ කිරීමට ඔබට අයිතියක් ඇත. අපහාස නඩුවක ප්‍රතිඵලයක් ලෙස අපහාසයට චෝදනා ලැබූ පුද්ගලයා බන්ධනාගාරගත කළ නොහැකි වන අතර ඒ සඳහා වන්දි ඉල්ලා සිටීමක් පමණක් කළ හැකි ය.

- ප්‍රචණ්ඩත්වට වෙත තුඩුදෙන වෛරී කථනය

ඔබේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස පහත සඳහන් කරුණු සමග සම්බන්ධ වන්නේ නම් ඒවා සීමා කළ හැකි ය.

- යුද්ධය ප්‍රවර්ධනය
- ජාතික, වාර්ගික හෝ ආගමික වෛරය ප්‍රචලිත කිරීම හෝ ප්‍රචණ්ඩත්වය ඇති කිරීමට අන්‍යන්ව පොළඹවන අයුරින් කටයුතු කරනු ලබන ප්‍රකාශයන්

ශ්‍රී ලංකාවේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය මගින් වෛරී කථාව සාපරාධී වරදක් පත්කර ඇති අතර එය වසර දහයක් දක්වා සිර දඬුවම් ලැබිය හැකි ය. ශ්‍රී ලංකාවේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය පනත යටතේ යමකු මෙම වරද සම්බන්ධයෙන් අත්තඩංගුවට ගනු ලැබුවහොත් මහේස්ත්‍රාත්වරයා හට ඇප ලබාදිය නොහැකි වන බැවින් ඔවුන්ට ඇප ඉල්ලීම සඳහා මහාධිකරණයට අයදුම් කිරීමට සිදුවනු ඇත.

- අධිකරණයට අපහාසකිරීම

අධිකරණය ඉදිරියේ නඩුවක් විභාග වෙමින් පවතී නම්, ඒ සම්බන්ධයෙන් බෙදාගත හැකිවනුයේ අධිකරණය ඉදිරියේ සිදු වූ දේ පිළිබඳ තොරතුරු පමණි. සාධාරණ නඩු විභාගයකට බලපාන අදහස් ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීමට පුද්ගලයෙකුට අවසර නොමැත.

## 09. කාන්තාවන් ආරක්ෂාකරනු ලබන අපරාධ නීතිය



පහත සඳහන් අපරාධයන්ගෙන් එකක් කාන්තාවන් හට සිදුවුවහොත් එය 1833 ශ්‍රී ලංකාවේ දණ්ඩනීති සංග්‍රහය යටතේ  වරදක් වන අතර ඔබ හට ඒ සම්බන්ධව පොලීසිය වෙත පැමිණිලි කළ හැකි ය. පොලිසිය විසින් ඒ සම්බන්ධව විමර්ශන කළ යුතු අතර ප්‍රමාණවත් සාක්ෂි තිබේ නම් වැරදිකරු යැයි සාධාරණ ලෙස සැකකරනු ලබන පුද්ගලයාට එරෙහිව අපරාධ නඩුවක් ගොනු කරනු ඇත.

| වරද සහ දණ්ඩනීති සංග්‍රහයේ ඊට අදාළ වගන්තිය | සටහන | දණ්ඩ නීති සංග්‍රහයේ දඬුවම් |
|---|---|---|
| **මනුෂ්‍ය ඝාතනය (293,294 සහ 295 වගන්තිය)** | කාන්තාවක් හෝ ගැහැණු දරුවකු ඝාතනය කිරීම හෝ ඝාතනයට හේතුවන ක්‍රියාවක් කිරීම | මරණීය දණ්ඩනය |
| **අඩන්තේට්ටම් කිරීම (342 වගන්තිය)** | බලය හෝ ප්‍රචණ්ඩත්වය භාවිත කරනු ලබනු ඇති බවට බිය ඇති කිරීම | උපරිම මාස 3 ක සිර දඬුවමක් දඩය රුපියල් 50 |
| **බරපතල තුවාල සිදුකිරීම** | ඕනෑම පුද්ගලයකුට ශාරීරික වේදනාව, රෝගයකට හෝ දුබලතාවයකට හේතුවන ක්‍රියාවක් | අවුරුදු 10ක් උපරිම සිර දඬුවමක්<br>දඩ මුදලක් |
| **අන්තරාදායක ආයුධ වලින් තුවාල වීම (317 වගන්තිය)** | අන්තරාදායක යැයි සැළකෙන ආයුධ මගින් තුවාල කිරීම. ගින්නෙන් රත්කරනු ලැබූ ද්‍රව්‍යයකින්, පුපුරණ ද්‍රව්‍යයකින් හෝ සතෙකු යොදාගනිමින් බරපතල තුවාල සිදුකිරීම | - අවුරුදු 10ක් උපරිම සිර දඬුවමක්<br>- දඩ මුදලක් |
| **දේපළ බලෙන් පැහැර ගැනීම සඳහා බරපතල තුවාල කිරීම** | නීති විරෝධී ලෙස හෝ බලහත්කාරයෙන් දේපළ හෝ වටිනා ඇපයක් ලබාගැනීම සඳහා බරපතල තුවාල කිරීම | - අවුරුදු 10ක් උපරිම සිර දඬුවමක්<br>- දඩ මුදලක් |
| **වසදීමෙන් තුවාල සිදුකිරීම (319 වගන්තිය)** | සෞඛ්‍යයට අතිශය හානිකර විෂක් හෝ වෙනත් ද්‍රව්‍යයක් ලබාදීමෙන් තුවාල සිදුකිරීම | - අවුරුදු 7 ක උපරිම සිර දඬුවමක්<br>- දඩ මුදලක් |
| **බරපතල තුවාලකිරීම**<br>**යන වගන්තිය පුළුල් කිරීම සඳහා  1995 දී නැවත අර්ථ දක්වන ලදී** | බරපතල තුවාල කිරීමේ ඇතැම් ආකාරයන්<br>- ස්ථිර පෙනීම අහිමිකිරීම හෝ ආබාධිත කිරීම<br>- නිත්‍ය ආබාධිතභාවයක් හෝ ශ්‍රවණ ආබාධයක් සිදුකිරීම<br>- මිනිස් සිරුරේ යම් අවයවක් විනාශ කිරීම<br>- යම් අවයවක හෝ ග්‍රන්ථියක බලය විනාශ කිරීම හෝ නිත්‍ය ලෙස දුර්වල කිරීම<br>- හිස හෝ මුහුණ නිත්‍ය ලෙස විරූප කිරීම | - අවුරුදු 10ක් උපරිම සිර දඬුවමක්<br>- දඩ මුදලක් |

| | | |
|---|---|---|
| | - අස්ථියක්, කාටිලේජ හෝ දතක් කැපීම හෝ භංග කිරීම හෝ අස්ථියක්, සන්ධියක් හෝ දතක් විසන්ධි කිරීම<br>- වින්දිතයා වෙත දැඩි ශාරීරික වේදනාවක් ඇතිවවන හෝ ඔහුගේ සාමාන්‍ය දෛනික කටයුතු වලට දින 20ක කාලයක් බාධාවන ඕනෑම තුවාලයක් | |
| **අපහරණය කිරීම**<br>**(දණ්ඩ නීති සංග්‍රහයේ 357 හා 358 වගන්තිය)**<br>**පැහැරගෙන යාම (353 වගන්තිය)** | නීත්‍යනුකූල ප්‍රවාහනය<br>- ශ්‍රී ලංකාවෙන් හෝ<br>- නීත්‍යනුකූල භාරකාරත්වයෙන්<br>අපහරණය කිරීම යනු බලහත්කාරය, බොරුකිරීම, අධිකාරිය අනිසි ලෙස භාවිත කිරීම හෝ වෙනත් ඕනෑම ආකාරයකින් ඕනෑම ස්ථානයකට යාමට පුද්ගලයෙකු පොළඹවයි | - අවුරුදු 7 ක උපරිම සිර දඬුවමක්<br>- දඩ මුදලක් |
| **අයුතු අවහිරය (330 වගන්තිය)** | පුද්ගලයකු හට තමාට සිටීමට අයිතියක් ඇති සහ යාමට අවශ්‍ය තැනක සිට තවත් ස්ථානකට යාම අවහිර කිරීම්(උදා: විසින් ගේ ගමනට බාධා කිරීම) | - උපරිම ලිහිල් මාසයක සිර දඬුවමක්<br>- දඩ රු. 50 |
| **අයුතු සිරකර තැබීම (331 වගන්තිය)** | යම් පුද්ගලයකු යම් සීමාවන්ගෙන් ඔබ්බට යාම නීතිවිරෝධීව වළක්වාලීම (උදා බී විසින් වයි නමැත්තාව කාමරයක දමා අගුළු දැමීම) | - උපරිම වසරක සිර දඬුවමක්<br>- දඩය රු 100<br>වසර 1 සිට 2 දක්වා සිර දඬුවමක් (දින 3 හෝ ඊට වැඩි ගණනක් නම්)*<br>වසර 3 ක සිර දඬුවමක් (දින 10 හෝ ඊට වැඩි ගණනක් නම්) |
| **ස්ත්‍රී දූෂණය (363 වගන්තිය)** | කැමැත්තෙන් තොරව ලිංගික සංසර්ගයේ යෙදීම<br>** වයස අවුරුදු 16ට අඩු දරුවකුගේ කැමැත්ත තිබුණ ද එය සාපරාධී වරදකි | බරපතල වැඩ සහිත සිරදඬුවම (අවුරුදු 7 සිට 20 දක්වා)<br>දඩ මුදල්<br>වින්දිතයා වෙත වන්දි |

| | | |
|---|---|---|
| **බරපතල ස්ත්‍රී දූෂණය** | බරපතල තත්ත්වයන් යටතේ<br>ස්ත්‍රී දූෂණය<br>a) රාජ්‍ය නිලධාරියෙකු විසින්<br>b) කාන්තා හෝ ළමා රක්ෂණ නිවාසයක දී<br>c) රෝහලක කළමණාකරණ පක්ෂය හෝ කාර්ය මණ්ඩලයේ නියුතු තැනැත්තකු<br>d) ගර්භනී කාන්තාවක්<br>e) වයස අවුරුදු 18 ට අඩු ස්ත්‍රියක්<br>f) මානසික හෝ ශාරීරක වශයෙන් ආබාධ සහිත ස්ත්‍රියක්<br>g) රංචු ගැසී ස්ත්‍රී දූෂණ කිරීම | බරපතල වැඩ සහිත සිරදඬුවම (අවුරුදු 10 සිට 20 දක්වා)<br>දඩ මුදල්<br>වින්දිතයා වෙත වන්දි |
| **බරපතල ලිංගික අපයෝජනය (365 ආ වගන්තිය)** | ලිංගික තෘප්තිය සඳහා ලිංගේන්ද්‍රය හෝ මිනිස් ශරීරයේ වෙනත් යම් කොටසක් හෝ යම් උපකරණයක් හෝ වෙනත් යම් තැනැත්තකුගේ විවරයක් තුළ හෝ ශරීරයේ කොටසක් එකී තැනැත්තාගේ කැමැත්ත නොමැතිව භාවිත කිරීම | බරපතල වැඩ සහිත සිරදඬුවම (අවුරුදු 5 සිට 20 දක්වා)<br>දඩ මුදල්<br>වින්දිතයා වෙත වන්දි<br>වින්දිතයා අවුරුදු 18 ට අඩු නම්<br>දඩ මුදල්<br>වින්දි බරපතල වැඩ සහිත සිරදඬුවම (අවුරුදු 7 සිට 20 දක්වා වින්දිතයා වෙත වන්දි |
| **ලිංගික අතවර කිරීම (345 වගන්තිය)** | වෙනත් පුද්ගලයකු වාචිකව, ශාරීරිකව හෝ ලිංගික කරදරයක් කිරීමට හෝ ලිංගික හිරිහැරයක් කිරීමට, ලිංගික අතවර කිරීමට පහරදීම හෝ සාපරාධී බලය භාවිත කිරීම. | උපරිම අවුරුදු 5ක සිර දඬුවමක්<br>දඩ මුදලක් |
| **සාපරාධී බිය ගැන්වීම** | තැති ගැන්වීමක් සිදුකරන අදහසින් හෝ තර්ජනය ක්‍රියාත්මක කරවීම වැළැක්වීමේ මාර්ගයක් වශයෙන් තමා නීත්‍යනුකූලව කිරීමට බැඳී නැති ක්‍රියාවක් කිරීමට හෝ නීත්‍යනුකූලව කටයුතු කිරීමෙන් වැළැක්වීම සඳහා යමකුගේ ශරීරයට හෝ කීර්තිවට හෝ දේපළවලට හෝ ඔහු සම්බිධතාවක් දක්වන වෙනත් කෙනෙකුට තර්ජන කිරීම | උපරිම අවුරුදු 2ක සිර දඬුවමක්<br>දඩ මුදලක් |

# 10. ගෘහස්ථ හිංසනය

## 10.1 ගෘහස්ථ හිංසනය යනු කුමක් ද?

ගෘහස්ථ හිංසනය යනු ඔබට සමීප සම්බන්ධතාවයක් ඇති පුද්ගලයකු විසින් සිදුකරන කායික හෝ වාචික ආකාරයෙන් සිදුකරන ඕනෑම හිංසනයකි.

### ගෘහස්ථ හිංසනයේ කායික ආකාරයන්

- මිනීමැරීම හෝ මිනීමැරීමට තැත්කිරීම
- රිදවීම,ශාරීරික (කම්මුල් පහර, කෙනිත්තීම,පයින් ගැසීම,කොස්සක්, ලී කැබැලි, වයර් හෝ පටි හෝ වෙනත් ඕනෑම ගෘහභාණ්ඩයක් භාවිත කර පහරදීම, පිළිස්සීම)
- දරුණු ලෙස පහරදීමෙන් තුවාල ඇතිවීම
- අන්තරායකර ආයුධ භාවිත කරමින් හානි සිදුකිරීම
- මුදල් හෝ දේපල යමෙකුට ලබා දී වෙනත් පුද්ගලයකුට තුවාල  සිදුකිරීම
- වස ලබාදී තුවාල හෝ හානි සිදුකිරීම
- පුද්ගලයකුට ඇවිදීම සිදුනොකිරීමට බලකිරීම
- පුද්ගලයෙකු නිවසින් හෝ වෙනත් ස්ථානයකින් පිටවීම බලහත්කාරයෙන් වැළැක්වීම
- පුද්ගලයෙකුට එරෙහිව බලය යෙදවීම
- බිය වැද්දීම සඳහා බලය භාවිත කිරීම
- පුද්ගලයකුට පහරදීම හෝ පයින්ගැසීම
- කැමැත්තකින් තොරව දරුවකු හෝ පුද්ගලයකු බලහත්කාරයෙන් රැගෙනයාම
- ස්ත්‍රී දූෂණය
- පුද්ගලයකුගේ ශරීරයට, කීර්තියට හෝ දේපළවලට තර්ජනය කිරීම

### වාචික ආකාරයෙන් සිදුකරනු ලබන ගෘහස්ථ හිංසනයන්

- අසාධාරණ අයුරින් පාලනය සිදුකිරීම හෝ චිත්තවේගීය වේදනාවන් ඇතිවන දෑ සිදුකිරීම (උදා නිරන්තර අපහාස කිරීම, දොස් පැවරීම, සමච්චල් කිරීම)
- අසාධාරණ චෝදනා එල්ල කිරීම
- පුද්ගලයකු අන්‍යන් සමගින් සම්බන්ධවීම වැළැක්වීම සඳහා වාචික බිය ගැනවීම භාවිත කරයි
- නින්දාවට හේතු වේ

## 10.2 ගෘහස්ථ හිංසනය සම්බන්ධ ආරක්ෂණ  නියෝගයක් ලබාගත හැක්කේ කාහටද?

- මාගේ සැමියා හෝ බිරිඳ
- මාගේ පෙර සැමියා හෝ පෙර බිරිඳ
- මා සමග ජීවත්වන පුද්ගලයා
- පියා, මව, සීයා ආච්චි, සුළු පියා, සුළු මව,

- පුතකු, දියණියක, මුණුබුරා, මිණිබිරිය, සුළු දියණිය, සහෝදරයෙක්, සහෝදරියක් අර්ධ සහෝදරයා හෝ සහෝදරිය, සුළු සහෝදරයා, සුළු සහෝදරිය,
- නැන්දා හා මාමලා
- ලේලියන් හා ඥාති පුත්‍රයන්
- ඥාති සහෝදරයන්

## 10.3 මට කුමන ආකාරයේ ආරක්ෂාවක් ලබාගත හැකි ද?

ඔබට හිංසනය සිදුකරන පුද්ගලයා සඳහා අධිකරණයට නියෝග ලබාදිය හැකි ය.

- ගෘහස්ථ හිංසනය පිළිබඳව වූ ඕනෑම ක්‍රියාවක් නතරකිරීම
- ඔබේ වෛවාහක නිවස වුවද ඔබ නැවතී සිටින ස්ථානය වෙත ප්‍රවේශ නොවීමට
- ඔබේ පදිංචියට,රැකියා ස්ථානයට හෝ පාසල වෙත ප්‍රවේශ නොවීමට
- ආරක්ෂාව ලබාගැනීම සඳහා ඔබ නැවතී සිටින කිසිදු නවාතැන් හෝ තාවකාලික ස්ථානයකට ප්‍රවේශ නොවීමට
- අධිකරණය විසින් අධීක්ෂණය හෝ නියෝග කරනු ලැබුවහොත් මිස ළමුන්ට වෙත ප්‍රවේශ විය නොහැක.
- ඔබ සහ ප්‍රචණ්ඩත්වය ඇතිකරන ලද පුද්ගලයා විසින් භාවිත කරන ලද ස්වර්ණාභරණ හෝ වෙනත් වටිනා දේයක් හෝ දේපළක් භාවිත නොකරන ලෙසට (උදාහරණයක් ලෙස නිවස , වාහන, ගෘහ භාණ්ඩ , ගෘහ උපකරණ)
- ඔබ හා සම්බන්ධ වීම හෝ ඔබ පසුපස ඒම සිදුනොකිරීම
- ඔබට සහය දක්වනු ලබන උපදේශකයින්, පාසල් ගුරුවරුන්, සමාජ සේවකයින් , නීතිඥයින් වැනි ඔබට සහය වන කිසිවකුට එරෙහිව ප්‍රචණ්ඩ ක්‍රියාවක් සිදුනොකිරීම
- අධිකරණයේ මතය අනුව සිදුවන ඕනෑම හැසිරීමක් මගින් බලපෑමක් වන පුද්ගලයකුගේ ආරක්ෂාව, සෞඛ්‍යය හෝ යහපැවැත්මට බලපාන නියෝගයක් හෝ අධිකරණයේ මතය අනුව වරදකරුට එරෙහිව ආරක්ෂක නියෝගයක් අවශ්‍ය වන වෙනත් පුද්ගලයෙකු වෙත නියෝග යක් ලබාදීමට
- අගතියට පත් පුද්ගලයා අසරණ තත්ත්වයකට පත් කිරීම සඳහා වාහක නිවස විකිණීමෙන් හෝ මාරු කිරීමෙන් පුද්ගලයකු නැවැත්වීම සඳහා නියෝග කිරීම.

## 10.4 මෙම ආරක්ෂණ නියෝගයන් ලබාගන්නේ කෙසේ ද?

ගෘහස්ථ හිංසනය පිළිබඳ සිද්ධියකින් පසු වහාම, ඔබට අධිකරණයේ ආරක්ෂණ නියෝග අවශ්‍ය යැයි ඔබ විශ්වාස කරන්නේ නම්, ඔබ විසින් කළ යුතු වන්නේ,

- ප්‍රාදේශීය පොලිස් ස්ථානයේ පැමිණිල්ලක් කර එම පැමිණිල්ලේ සහතික කළ පිටපතක් ලබාගන්න
- ඔබට කිසියම් තුවාලයක් ඇත්නම්, ඔබ විසින් රජයේ රෝහලකට ඇතුළත්ව වෛද්‍ය පරීක්ෂණයක් සිදුකර ඔබේ තුවාල සම්බන්ධව අධිකරණ වෛද්‍ය නිලධාරියකු වෙත වාර්තා කළ යුතු ය.

- පිටතට පෙනෙන ශාරීරික තුවාල තිබේ නම්, ඔබේ තුවාල පිළිබඳ ඡායාරූප සාක්ෂි ලබාගත යුතු වේ. ඔබ විශ්වාස කරන කෙනෙකු ඡායාරූප ගැනීමට ඔබට උදව්කළ හැකි අතර ඡායාරූපවල ඔබව හඳුනාගැනීමටත් තුවාල පැහැදිලිව දැක ගැනීමටත් හැකි විය යුතු ය.

- සිදු වූ සෑම දෙයක්ම හෝ ඔබට මතක ඇති තරමේ ප්‍රමාණය ලිවිය යුතු ය. මේ සඳහා මට උදව්කිරීමට ඔබට උදව් ලබාගත යුතු ය.

- ආරක්ෂණ නියෝග සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ හැකි වනුයේ පොලීසියට හෝ නීතිඥයකුට පමණි. අධිකරණයට ඉල්ලීමක් කරන ලෙස ඔබට පොලීසියෙන් ඉල්ලා සිටිය හැකි අතර ඔබට නීතිඥයකුගෙන් ද උපදෙස් ලබාගත හැකි ය. ඔබේ නඩුව භාරගැනීමට කැමති නීතිඥයකු වෙත ඔබ දැනුම් දිය යුතු ය. ඔබට ලබාගත හැකි සහනය සහ ඉදිරියේ දී ඔබ කළ යුතු වන්නේ කුමක් ද යන්න ඔබේ නීතිඥවරයා වෙත ඔබ සොයාගත යුතු ය.

## 10.5 මහේස්ත්‍රාත් අධිකරණයේ ක්‍රියාවලිය කුමක් ද?

- අයදුම්පත ගොනු කරන්න (මා වෙනුවෙන් නීතිඥයකුට හෝ පොලීසිය මහේස්ත්‍රාත් අධිකරණය වෙත අයදුම්පතක් ගොනු කළ හැකිය)
- අයදුම්පත ගොනු කළ වහාම කඩිනම් නියෝග ලබාදිය හැකි ය.
- අයදුම්පත සම්බන්ධ විමර්ශන සති දෙකක් තුළ ලබාදිය යුතු ය
- පරීක්ෂණයෙන් පසුව, ආරක්ෂණ නියෝග අධිකරණය විසින් ලබා දෙන්නේ නම්, එකී නියෝගය වසරක් සඳහා වලංගු විය යුතු ය.
- වසරකට පසුවත් අඛණ්ඩව තර්ජන පවතී නම් , ඔබට අයදුම්පත දීර්ඝ කිරීම සඳහා ඉල්ලීමක් කිරීම හෝ නව අයදුම්පතක් ගොනු කිරීමට අධිකරණයෙන් ඉල්ලා සිටිය හැකි ය.

## 11. නෛතික ප්‍රතිකර්ම

මෙම කොටස මගින් රාජ්‍ය නිලධාරීන්ගේ ක්‍රියාවකට හෝ නොකරහැරීමකට එරෙහිව මහජනතාවට ලබාගත හැකි විවිධ නීතිමය පිළියම් සාකච්ඡා කරනු ලබන අතර ප්‍රධාන ප්‍රතිකර්ම 4ක් පුළුල්ව සාකච්ඡා කරනු ලබයි.



- පොලිස් පැමිණිලි
- මූලික අයිතිවාසිකම් අයදුම්පත්
- රිට් අයදුම්පත්
- විශේෂ ස්වාධීන අධිකාරීන් වෙත පැමිණිලි කිරීම

### 11.1 පොලිස් පැමිණිල්ලක් සිදුකිරීම

**මා විසින් පොලිස් පැමිණිල්ලක් සිදුකළ යුත්තේ කුමන ස්ථානයේ ද?**

වෙනත් ඕනෑම පුරවැසියකු මෙන් රාජ්‍ය නිලධාරීන් ද රටේ අපරාධ සහ සිවිල් නීතියටත් යටත් වේ.මීට අමතරව රජ්‍ය නිලධාරීන් ද මහජන නීතියට යටත් වේ. මූලික අයිතිවාසිකම් සහ රිට් අයදුම්පත් සඳහා ද නීතිය මෙයට අන්තර්ගත වේ.

ඔබ කැමති පොලිස් ස්ථානයේ පැමිණිලි සටහන් කළ හැකි ය. ඔබට ආසන්නතම හෝ සිද්ධිය සිදුවූ ස්ථානයට ආසන්නව පොලිස් පැමිණිල්ලක් ගොනු කිරීම පහසු ය. මෙය වඩාත් ප්‍රායෝගික තත්ත්වය වන්නේ මෙය පොලීසියට පරීක්ෂණයක් කිරීමට ඉඩ සළසන බැවිනි.

ඔබේ පැමිණිල්ල භාරගැනීම කිසිදු පොලිස් ස්ථානයකට ප්‍රතික්ෂේප කළ නොහැකි ය. කිසියම් පොලිස් ස්ථානයක පැමිණිල්ලක් කිරීම ඔබට ආරක්ෂිත යැයි හැඟෙන්නේ නැත්නම් , ඔබට එය වෙනත් පොලිස් ස්ථානයක හෝ පොලිස් මූලස්ථානයේ දී පවා කළ හැකි ය.

**මාගේ නීතිඥයා හට පැමිණිය හැකි ද?**

යමෙකු නීතිඥයකු තෝරාගන්නේ නම් , පොලිස් පැමිණිල්ලක් කළ අවස්ථාවේ දී සහ පසුව විමර්ශනය අතරතුර යමෙකුගේ නීතිඥයකු හට ඉදිරිපත් විය හැකි ය.

**මා හට තෝරාගත් ඕනෑම භාෂාවකින් මා හට පැමිණිල්ලක් සිදුකළ හැකි ද?**

පුද්ගලයෙකුගේ අභිමතය පරිදි පොලිස් පැමිණිල්ලක් ඉදිරිපත් කළ හැකි ය.තමන්ට නොතේරෙන භාෂාවකින් ගොනු කරන ලද පොලිස් පැමිණිල්ලක් කිරීමට හෝ අත්සන් කිරීමට හෝ අත්සන් කිරීමට පුද්ගලයකුට බලය කළ නොහැක. ඔබට තේරුම්ගත හැකි භාෂාවකින් පැමිණිල්ල ලියාගැනීමට පොලීසියට නොහැකි නම්, ඔබේ අත්සන තැබීමට පෙර ලිඛිත අන්තර්ගතය පිළිබඳව ඔබට පැහැදිලි කළ යුතු ය.

**මගේ පැමිණිල්ල මා විසින්ම ලියා පොලිස් පැමිණිලි පොතේ ඇලවිය හැකි ද?**

ඔව්,ඔබේ පැමිණිල්ල ලියා හෝ ටයිප් කර අදාළ පොලිස් ස්ථානයට ගෙන යා හැකි අතර, එම පැමිණිල්ල පොලිස් ස්ථානයේ තොරතුරු පොතේහි අලවන්නැයි ඉල්ලා සිටිය හැකි ය. ඔබේ සම්පූර්ණ නම, ජාතික

හැඳුනුම්පත් අංකය, ලිපිනය හා දුරකථන අංකය එහි පළමු පේළියේ ලිවීමට මතක තබාගන්න. ඔබගේ ලිඛිත පැමිණිල්ල අවසානයේ දිනය යොදා ඔබේ අත්සන හෝ මාපට ඇඟිලි සළකුණ තබන්න.

**කාන්තා හා ළමා කාර්යාංශය**

කාන්තාවන් සහ ළමා වින්දිතයන් සම්බන්ධව වන විශේෂ පැමිණිලි අදාළ පොලිස් ස්ථානයේ කාන්තා හා ළමා ඒකකයේ දී පැමිණිලි කළ හැකි ය.

## 11.2 අධිකරණයේ නඩු පැවරීම



පහත දැක්වෙන අවස්ථාවලදී, තත්ත්වය නිවැරදි කිරීම හෝ යම් සහනයක් ලබාගැනීම සඳහා අදාළ ආයතනයට හෝ නිලධාරියාට එරෙහිව නඩු පැවරීම සඳහා ඔබට සළකාබැලීමක් කළ හැකි ය.

- ඔබේ අයිතිවාසිකම් උල්ලංඝණය වූ අවස්ථාවක දී
- රාජ්‍ය ආයතනයක් හෝ නිලධාරියකු විසින් නීතිවිරෝධී දෙයක් කර තිබෙනම්
- හොඳ හේතුවක් නොමැතිව රාජ්‍ය ආයතනයක් හෝ නිලධාරියකු විසින් තම බලාධිකාරය තුළ සිදුකළ හැකි ක්‍රියාවක් කිරීම ප්‍රතික්ෂේප කරන්නේ නම් හෝ
- ඔබට ඇහුම්කම් දීමට අවස්ථාවක් ලබා නොදී රාජ්‍ය ආයතනයක් හෝ නිලධාරියෙකු ඔබට බලපානු ලබන තීරණයක් ගෙන තිබෙන අවස්ථාවක දී

**නඩු පැවරීමේ ප්‍රමාදයන් නීතිය නොයිවසයි**

**රජයට එරෙහිව මා හට පැවරිය හැකි නඩු මොනවා ද?**

නිශ්චිත කාල සීමාවක් තුළ හෝ අවම වශයෙන් සාධාරණ කාලයක් ඇතුළත නඩු පැවරීම සම්බන්ධව නීතිය ඉතා නිශ්චිතව කරුණු දක්වා ඇත. නීතියෙන් බලාපොරොත්තු වනුයේ මිනිසුන් වහාම ක්‍රියාත්මක වීමයි. වෙනත් හේතු නිසා ඔබ ඔබේ නඩුව ගොනු කිරීම ප්‍රමාද කරන්නේ නම්, සිදුව ඇති දේ පිළිබඳ පැමිණිලි කිරීම සඳහා ඔබ කැමැත්තක් නොදැක්වීම හෝ උනන්දුවක් නොදැන්වූ බවක් පෙනීයයි.

**වැදගත් පළමු පියවරයන්**

- සිද්ධියෙන් පසුව වහාම නීතිඥවරයෙක් සම්බන්ධ කරගැනීම.ඔබේ සිද්ධිය සම්බන්ධ වඩාත් සුදුසු ක්‍රමය සොයාගැනීමට ඔබේ නීතිඥවරයාගේ උපදෙස් ලබාගන්න. ඔබට නීතිඥයකුගේ උපදෙස් ලබාගැනීමට නොහැකි නම් ඔබට නීති ආධාර කොමිෂන් සභාවේ සහාය ලබාගත හැකි ය. ඔබට නීති ආධාර කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ දුරකථන අංකය වන 0112433618 අමතා ඔබට ළඟම කාර්යාලයේ අංකය ඉල්ලාගත හැකි ය.
- සිද්ධියෙන් දින 30ක් ඇතුළත ජාතික මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලිඛිත පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම හෝ ඔබට හැකියාව තිබෙන ඕනෑම සන්නිවේදනයක් මගින් ඔබට අගතියට පත්ව ඇති බව දැන ගැනීමට ඉඩසැළැස්විය යුතු ය. ඔබ එම පැමිණිල්ලේ රිසිට්පත හෝ පිළිග ැනීම ලබාගැනීමට වග බලාගත යුතු අතර, එම පැමිණිල්ලේ යොමු අංකය දැනගත යුතු ය. ශ්‍රී ලංකා මානව හිමිකම් සභාවේ ශාඛා රටපුරා පිහිටා ඇති අතර ඔබය එහි ප්‍රධාන කාර්යාලය වෙත 0112505575 අංකය වෙත ඇමතුමක් ලබාදී ඔබට ළඟම කාර්යාලයක තොරතුරු ලබාගත හැකි ය.

- ඔබේ අයිතිවාසිකම් උල්ලංඝණය කර ඇති හෝ යම් වැරැද්දක් කර ඇති රාජ්‍ය නිලධාරියාට හෝ රාජ්‍ය ආයතනයේ ප්‍රධානිය වෙත ලිඛිත පැමිණිල්ලක් යොමුකරන්න.
- උල්ලංඝණය කිරීම හෝ වැරදික්‍රියාව සම්බන්ධ සියලු සාක්ෂි එක්රැස්කරගැනීම සහ ඒවා ආරක්ෂාකාරීව තබාගැනීම.අදාළ සියුලු සිද්ධීන්, ඔබ කළ පැමිණිලි,පැමිණිල්ල සම්බන්ධයෙන් ඔබ විසින් කථාකරන ලද පුද්ගලයින්ගේ නම් සහ ඔවුන්ගේ ප්‍රතිචාර පිළිබඳ මෙන්ම ඒවායේ දිනයන් සහ වේලාවන් පිළිබඳව වාර්තාවක් තබා ගැනීමට වග බලාගත යුතු ය. හැකි සෑම අවස්ථාවක දීම ඊට සම්බන්ධ සියලු පුද්ගලයින්ගේ නම් සහ තනතුරු පිළිබඳ සටහන් ලබාගන්න.

## රජයට එරෙහිව මා හට පැවරිය හැකි නඩු මොනවා ද?

රජයේ ක්‍රියාමාර්ගක් හෝ නොකරහැරීමක් පිළිබඳ පැමිණිලි කිරීමේ දී නඩු වර්ග දෙකක් ගොනු කළ හැකි ය. ඒවා නම්

- මූලික අයිතිවාසිකම් අයදුම්පතක් (විස්තර පහත වගුවේ දක්වා ඇත)
- මූලික අයිතිවාසිකම් අයදුම්පතක් (විස්තර පහත වගුවේ දක්වා ඇත)

## මූලික අයිතිවාසිකම්

| | |
|---|---|
| | මූලික අයිතිවාසිකම් යනු ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිළිගත් හා ආරක්ෂා කරනු ලබන්නා වූ මානව අයිතිවාසිකම් වේ. මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කිරීමක් සිදුවනුයේ රජයේ ක්‍රියාවක් හෝ නොකරහැරීමක ප්‍රතිඵලයක් මගිනි. අපගේ නීතිය සහ ව්‍යවස්ථාව මගින් මූලික අයිතිවාසිකම් පිළිගනු ලබයි. |
| මාගේ මූලික අයිතීන් මොනවා ද? | - සිතීමේ හා හෘද සාක්ෂියේ නිදහස<br>- ආගමික නිදහස (ආගමක් ඇදහීමට හා තෝරාගැනීමට ඇති නිදහස)<br>- වධහිංසාවෙන් හා අවමන් සහගත සැළකීම්වලට ලක්නොවීමට ඇති අයිතිය<br>- වරදකරු බවට අධිකරණය ඉදිරියේ ඔප්පුවන තුරු නිර්දෝෂී පුද්ගලයෙකු වශයෙන් සැළකීමට ඇති අයිතිය<br>- වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබුවහොත් ඔබ ආරක්ෂා කර ගැනීමේ අයිතිය.<br>- නෛතික හේතුවක් සහ නිසි ක්‍රියාපටිපාටියකින් තොරව අත්අඩංගුවටය නොගැනීමට ඇති අයිතිය |

| | |
|---|---|
| | - නීතියට අනුකූලව රැඳවියන්ව අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට ඇති අයිතිය<br>- ඒ සඳහා බලය පවරනු ලබන අධිකරණ නියෝග යක් තිබෙන අවස්ථාවක දී හැර තවදුරටත් අත්තඩංගුවේ තබා නොගැනීමට ඇති අයිතිය<br>- නීතිමය ක්‍රියාපටිපාටියට අනුව නෛතික හේතුවක් නොමැතිව දඬුවම් නොකිරීමට ඇති අයිතිය<br>- නීතිය ඉදිරියේ සමාන ආරක්ෂාවක් සඳහා ඇති අයිතිය (එනම් නීතිය ඉදිරියේ සමානව සැළකීම)<br>- ජාතිය, ආගම ,භාෂාව, කුලය, ස්ත්‍රීපුරුෂ භාවය, දේශපාලන මතය, උපන් ස්ථානය ආදිය මත පදනම්ව වෙනස් කොට සැළකීමයකින් තොරව සමානව සැළකීමේ අයිතිය<br>- සාමකාමීව එක්රැස්වීමේ නිදහස, උදාහරණ ී සාමකාමී විරෝධතා සහ උද්ඝෝෂණ , රැස්වීම් ආදිය පැවැත්වීම සඳහා වන නිදහස<br>- භාෂණයේ හා අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස, තොරතුරු ලබාගැනීමේ අයිතිය ද මීට ඇතුළත් ය<br>- පුවත්පත්,විද්‍යුත් මාධ්‍ය,ස්වාධීන ගුවන්විදුලි හෝ රූපවාහිනී මහජන ප්‍රසංග,මහජන අවිහිංසාවාදී විරෝධතා හරහා සිදුකරනු ලබන ප්‍රකාශනයන් හෝ විකාශනය සහ තොරතුරු ලබාගැනීම<br>- වෘත්තීය සමිතියක් පිහිටුවීමට හා සම්බන්ධවීමට ඇති නිදහස<br>- ආගම ඇදහීමට හෝ ඉගැන්වීමට ඇති නිදහස<br>- ඔබගේ භාෂාව හා සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීමේ නිදහස<br>- ශ්‍රී ලංකාවට ආපසු යාමට ඇති නිදහස<br>- සමාගමයේ නිදහස - එනම් වෙනත් පුද්ගලයින්,කණ්ඩායම් ආදිය ඇසුරු කිරීමේ අයිතිය<br>- ශ්‍රී ලංකාව තුළ යෑමේ ඊමේ නිදහස සහ වාසස්ථානයක් තෝරාගැනීම සඳහා ඇති නිදහස<br>- නීත්‍යනුකූල ඕනෑම රැකියාවක නිරතවීමේ නිදහස<br>- ඡන්ද අයිතිය<br>- ජීවත්වීමේ අයිතිය |

| | |
|---|---|
| මූලික අයිතිවාසික මත ඇති සීමා | පුද්ගලයකු සතු මූලික අයිතිවාසිකම් සීමා කළ හැකි වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පවතින හේතු මත පමණි. නමුත් ඇතැම් මූලික අයිතිවාසිකම් කිසිදු හේතුවක් නිසා සීමා කළ නොහැකි ය. ඒවා නම්<br>- සිතීමේ හා හෘද සාක්ෂියේ නිදහස<br>- ආගමික නිදහස (එනම් ආගමක් ඇදහීමට හා අනුගමනය කිරීම සඳහා ඇති නිදහස)<br>- වධහිංසා හා අවමන් සහගත සැළකීම්වලට ලක්නොවීමේ නිදහස |
| මූලික අයිතිවාසිකම් අයදුම්පතක් ගොනු කළ හැකි වනුයේ කා හට ද? | මූලික අයිතීන් උල්ලංඝණය වූ තැනැත්තා විසින් සාමාන්‍යයෙන් මූලික අයිතිවාසිකම් අයදුම්පතක් යොමුකළ යුතු වේ. මෙම නීතියට ඉතාමත් සීමා සහිත ව්‍යතිරේඛයන් ඇත. |
| මූලික අයිතිවාසිකම් අයදුම්පතක් ගොනු කළ හැකි ස්ථානය කුමක් ද? | කොළඹ 12 පිහිටි ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ දී |
| මූලික අයිතිවාසිකම් පෙත්සමක් මා විසින් ගොනු කළ යුතුවන්නේ කවරදා ද? | උල්ලංඝණය සිදුවීමෙන් දින 30 ක් ඇතුළත සාමාන්‍යයෙන් මූලික අයිතිවාසිකම් අයදුම්පතක් යොමු කළ යුතු ය. |
| මා හට ලබාගතහැකි සහන මොනවා ද? | ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ලබාදිය හැකි සහනය වනුයේ වගඋත්තරකරු (මූලික අයිතිවාසිකම් නඩුවක් ගොනු කරන ලද්දේ යම් තැනැත්තකුට එරෙහිව ද ඒ තැනැත්තා) විසින් වින්දිතයාගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කර ඇති බවට අධිකරණය විසින් ප්‍රකාශයක් නිකුත් කිරීම.<br>මූල්‍ය වන්දි ලබාදිය හැකි නමුත් මෙය ඉතා වැදගත් මුදලක් නොවේ. |
| නීතිඥයකුගේ සහායක් නොමැතිව මා හට මූලික අයිතිවාසිකම් අයදුම්පතක් ගොනු කළ හැකි ද? | වින්දිතයා හට නීතිඥයකුගේ සහාය ලබාගැනීම සඳහා ප්‍රවේශයක් නොමැති නම් , අගවිනිසුරුවරයා වෙත යොමුකරනු ලබන ලිපියක් (ලියාපදිංචි තැපෑලෙන් යැවීම වඩාත් සුදුසු වේ) මගින් ඉල්ලුම් කළ හැකි ය. |

## රිට් ආඥා

| | |
|---|---|
| රිට් අයදුම්පතක් යනු | රිට් අයදුම්පතක් යනු රජයේ ක්‍රියාවක් හෝ නොකරහැරීමක් අභියෝගයට ලක්කරනු ලබන අයදුම්පතක් වේ.<br>■ නීතිවිරෝධී ක්‍රියාවක් (නීතය මගින් ඉඩ ලබානොදෙන ක්‍රියාවක්)<br>■ අසාධාරණ හෝ<br>■ අත්තනෝමතික (පුද්ගල කැමැත්ත මත ,පහසුව හෝ අනුග්‍රහය මත පදනම්ව ගනු ලබන තීරණ, බොහෝවිට සාධාරණ තීරණයක් නොවේ)<br><br>රිට් අයදුම්පත් සඳහා වන උදාහරණ<br>■ අතුරුදහන් වූ හෝ අවිධිමත් අයුරින් රැඳවුම් භාරයේ සිටින පුද්ගලයෙකු අධිකරණය වෙත ඉදිරිපත් කරන ලෙස නියෝගයක් ඉල්ලා සිටිය හැකි ය<br>■ රජයේ නිලධාරියකු විසින් කිසිදු නෛතික බලයක් නොමැතිව තීරණයක් ගෙන තිබේනම්, එකී තීරණය අභියෝගයට ලක්කර අවලංගු කළ හැකි ය<br>■ රාජ්‍ය නිලධාරියෙකු හට තීරණයක් ගැනීම සඳහා බලය තිබෙන නමුත් සාධාරණ නොවන හෝ අසාධාරණ තීරණයක් ගනු ලැබුවේ නම් හෝ අදාළ සියලු කරුණු සළකා නොබලා එකී තීරණය ගනු ලැබුවේ නම්, එම තීරණය අභියෝගයට ලක්කර අවලංගු කළ හැකි ය.<br>■ නීත්‍යනුකූලව ඔහුට හෝ ඇයට හිමිකම තිබීමේ පදනම මත ඔහුට හෝ ඇයට ප්‍රතිලාභයක් (උසස්වීමක් වැනි) දෙයක් ලබාදෙන ලෙසට පුද්ගලයකු හට රිට් අයදුම්පතක් ඉදිරිපත් කළ හැකි ය<br>■ පුද්ගලයකු රජයේ ධුරයක් සඳහා නිසි පරිදි පත්කර නොමැති නම්, ඔහු විසින් එකී රජයේ ධුරය දැරීම අභියෝගයට ලක් කළ හැකි ය. |
| රිට් අයදුම්පතක් ගොනු කිරීමේ හැකියාව තිබෙනුයේ කවරකු හට ද? | රාජ්‍ය නිලධාරියෙකුගේ හෝ රාජ්‍ය ආයතනයක තීරණයක්, ක්‍රියාවක් හෝ අකාර්යක්ෂමතාවයෙන් පීඩාවට පත් පුද්ගලයන් හට අධිකරණයෙන් ඉල්ලීමක් සිදුකළ හැකි ය. ඇතැම්විට පුද්ගලයකුට පොදු මහජනතාවගේ අභිමතය පරිදි අයදුම්පතක් ගොනු කළ හැකි වේ. |

| | |
|---|---|
| මා විසින් රිට් අයදුම්පත් ගොනු කළ යුතු වනුයේ කුමන ස්ථානයකින් ද? | කොළඹ 12 පිහිටි අභියාචනාධිකරණයේ හෝ අදාළ පළාතේ පළාත්බද මහාධිකරණයේ දී ය |
| මා විසින් රිට් අයදුම්පතක් ගොනු කළ යුතු වන්නේ කවදා ද? | අදාළ නීතිවිරෝධී ක්‍රියාව සිදුකිරීමෙන් පසු සාධාරණ කාලයක් තුළ නඩුව ගොනු කළ යුතු ය. නියමිත වේලාවට නඩුව ගොනු කර තිබේ ද නැද්ද යන්න අධිකරණය විසින් තීරණය කරනු ඇත. එබැවින් හැකි ඉක්මනින් නඩුව ගොනු කිරීම ඉතා වැදගත් වේ. |

## 11.3 ස්වාධීන කොමිෂන් සභා අධිකාරීන්

පුද්ගලයන් හට ඔවුනගේ කරුණාට අදාළවන ස්වාධීන කොමිෂන් සභා හෝ අධිකාරීන් වෙත ද පැමිණිලි සිදුකළ හැකි ය. මේවාට ඇතුළත් වනුයේ

- මූලික අයිතිවාසිකමක් හෝ වෙනත් මානව හිමිකමක් උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාව වෙතට
- අල්ලස් හෝ දූෂණ සිදුවීම් සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව (CIABOC) වෙත
- පොලිස් නිලධාරීන්ගේ ක්‍රියා හෝ ක්‍රියාවන්ට එරෙහිව සිදුකරන ලබන පැමිණිලි සඳහා ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත
- රාජ්‍ය නිලධාරීන් විසින් ළමුන්ට එරෙහිව සිදුකරන ලබන උල්ලංඝණය කිරීම් පිළිබඳව වන පැමිණිලි සඳහා ජාතික ළමා අරක්ෂණ අධිකාරිය (NCPA)

**මතක තබාගත යුතු දෑ**

- කොමිෂන් සභාවක් වෙත හෝ ආයතනයක් වෙත ඔබ විසින් සිදුකරනු ලබන පැමිණිල්ල පිළිගත් පසු ඔවුන් ලබාදෙනු ලබන යොමු අංකය හෝ රිසිට්පත ලබාගැනීමට සැමවිටම වගබලාගන්න
- ඔබ විසින් පැමිණිල්ලක් සිදුකිරීමට යනවිට යමකු ඔබ සමග රැගෙන යා හැකි ය. ඔබට අවශ්‍ය නම් ඔබත් සමග එම ස්ථානයට නීතිඥවරයෙකු රැගෙන යා හැකි ය.

**මෙම අත්පොතෙහි සරළ හා සාමාන්‍ය පැහැදිලි කිරීමක් ඇති බව මතක තබාගන්න, නීති සංශෝධනය කරනු ලැබිය හැකි අතර මෙම අත්පොතෙහි අන්තර්ගත සීමිත තොරතුරු ප්‍රමාණය මගින් ඒකාරාශී කරගත නොහැකි තවත් සංකීර්ණතා තිබිය හැකි ය. ඔබට නීත්‍යනුකූල ප්‍රශ්නයක් තිබේ නම් කරුණාකර අවශ්‍ය නීතිමය උපදෙස් ලබාගන්න.**